# THE WHITE HACKLE



ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

இலங்கை காலாட்படை சஞ்சிகை

www.army.lk/lightinfantry



81
ISSUE
July - September
2014


රේම ශ්‍රීලපාහ මානි I (සෙව් සම්බන්ධීකරන)
නි/3364 ලුතිතන් කර්නල්
බීජේ ලේකම්ගේ ආර්එස්පී ශ්‍රීලපාහ


අණදෙන නිලධාරි 25 ශ්‍රීලපාහ
නි/63010 මේජර්
ආර්ජී සමරනායක පීඑස්සී ශ්‍රීලපාහ


දෙවන අණදෙන නිලධාරි 8 ශ්‍රීලපාහ
නි/65516 මේජර්
අයිකේජීසී කුමාර ආර්එස්පී ශ්‍රීලපාහ


විධායක අධිකාරි 17 (සෙව්) ශ්‍රීලපාහ
නි/6193 කපිතාන්
කේඩීඩීඑන් රණසිංහ ශ්‍රීලපාහ

# සුබ මොහොතින් නව තනතුරට පත් වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම්..!


රෙජිමේන්තු සැරයන් මේජර්
රේම ශ්‍රීලපාහ සෙ/305674 බනි I
ඩබ්ලිව්පීපී වමින්ද ආර්එස්පී


රෙජිමේන්තු සැරයන් මේජර්
4 ශ්‍රීලපාහ සෙ/309171
බනි I කේජී ටිකිරිබණ්ඩා


රෙජිමේන්තු සැරයන් මේජර්
රෙජිමුබ ශ්‍රීලපාහ සෙ/307111 බනි I
යුකේඅයි චන්ද්‍රකුමාර ආර්ඩබ්ලිව්පී


රෙජිමේන්තු සැරයන් මේජර්
8 ශ්‍රීලපාහ සෙ/305927 බනි I
එස්ඩීඑස් පුෂ්ප කුමාර ආර්එස්පී


රෙජිමේන්තු සැරයන් මේජර්
10 ශ්‍රීලපාහ සෙ/304988
බනි I ඒකේ වීරසිංහ


රෙජිමේන්තු සැරයන් මේජර්
12 ශ්‍රීලපාහ සෙ/13081 බනි I
ආර්එම්සී රාජපක්ෂ ආර්එස්පී


රෙජිමේන්තු සැරයන් මේජර්
19 ශ්‍රීලපාහ සෙ/306117
බනි I කේජ්ආර් කොඩිතුවක්කු ආර්එස්පී


උපකරණ පාලන සැරයන් මේජර්
19 ශ්‍රීලපාහ සෙ/309330
බනි II අනුර කුමාර ඒජී


උපකරණ පාලන සැරයන් මේජර්
4 ශ්‍රීලපාහ සෙ/306635
බනි II මාරසිංහ එම්ජීඑස්


රෙජිමුබ ශ්‍රීලපාහ උපකරණ පාලන
සැරයන් මේජර් සෙ/306834
බනි II දිමුතු කේජීබීසී ආර්ඩබ්ලිව්පී


ප්‍රධාන ලිපිකරු 20 ශ්‍රීලපාහ
සෙ/305797 බනි II
වීරකෝන් එස්එස්


ප්‍රධාන ලිපිකරු 12 ශ්‍රීලපාහ
සෙ/306525 සැරයන්
තිස්ස කුමාර ආර්පී


සරඹ උපදේශක 10 ශ්‍රීලපාහ
සෙ/303985
සැරයන් රත්නායක ආර්එම්ඩී


ප්‍රධාන ලිපිකරු 19 ශ්‍රීලපාහ
සෙ/316967 සැරයන්
අබේවික්‍රම පීඩීඅයිඑන් ආර්එස්පී

# THE WHITE HACKLE

81st ISSUE - July - September 2014 www.army.lk/lightinfantry

Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry


# CONTENTS

PAGE


- අදහස් උදහස් හා විවේචන 02
- බ්‍රිගේඩියර් නිලයට උසස්වීම් ලැබූ ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 03
- නාගරික සංවර්ධන හා ආරක්ෂක අමාත්‍යාංශ සේවාවනිතා ශාඛාවෙන් රණවිරුවෙකුට සෙවණක් 04
- THE DEATH OF BRIGADIER M.M. KULATUNGE IS ANNOUNCED WITH DEEPEST CONDOLENCE 05
- ශ්‍රීලපාහ ඒකක පුවත් 06 – 11
- සේවාවනිතා විත්ති 12 – 13
- ශ්‍රීලපාහ ඒකක පුවත් 14 – 17
- Vivid Memories
  Lieutenant General HV Atukorale (Retired) VSV psc FBIM 18 – 19
- රෙජිමේන්තු අභිනන්දන 20 – 21
- ජාතික හා ජාත්‍යන්තර ජයගත් පාබල තරුව 22
- පසෙක්ෂෙන් ගිය මහත්වරුනි පනාගොඩට ඇවිත් යන්න 23
- ශ්‍රීලපාහ ඒකක පුවත් 24 – 25
- ක්‍රීඩා පුවත් 26
- ශ්‍රීලපාහ ඒකක පුවත් 27
- උපන් දින සුබ පැතුම් 28 – 29
- තල් අරඹේ සිට 30
- ශ්‍රීලපාහ ඒකක පුවත් 31
- පාබල හමුදා තරු 32
- ශ්‍රීලපාහ ඒකක පුවත් 33 – 35
- රනින් ජයගත් පාබල පුතුන් 36
- සංග්‍රාමික වෙඩි තැබීමේ තරඟාවලිය වර්ණවත් කළ ශ්‍රීලපාහ තරු 37
- තල් අරඹේ සිට 38
- දසුනේ හසුන 39
- ප්‍රහේලිකා අංක 60 39 – 40





15 සදා අමරණීයයි විරුවන් සැමදා



22 දුකේදී සැපේදී නිරන්තරයෙන් කැප වී



35 ජවය හා ශක්තිය සමඟින් ක්‍රීඩාවෙන් ඉදිරියට




## කවරයේ කථාව

ශ්‍රීලපාහ රෙජිමේන්තුවට විශිෂ්ටතම සේවාවක් ඉටු කරනු ලැබූ දනට විශ්‍රාම සුවෙන් සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනකු වන ලුතිතන් ජෙනරාල් එච්වී අතුකෝරාළ (විශ්‍රාමික) වීඑස්වී පීඑස්සී එෆ්බීඅයිඑම් හා මේජර් ජෙනරාල් එන් මල්ලවආරච්චි (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත 2014 සැප්තැම්බර් මස 30 දින යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් දයා රත්නායක තුමන් හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් අමල් කරුණාසේකර තුමන් විසින් සමරු තිළිණ ලබාදුන් අයුරු


Printed by

වයිට් හැකල් මුද්‍රණාලය

Sri Lanka Light Infantry
Army Cantonment
Panagoda, Homagama.
T:P: - 0112098133
Ext - 57660
Fax - 0112855204
E-mail - whitehacklesIli@gmail.com

# THE WHITE HACKLE

SRI LANKA

LIGHT INFANTRY QUARTERLY

Colonel of The Regiment

Maj Gen KADA Karunasekara RSP USP ndu psc

Centre Commandant

Brig CD Weerasuriya RSP

Chief of the Staff RHQ SLLI

Col AS Wickramasena RWP RSP psc

Adjutant RHQ SLLI

Maj TWGDM Amarasinghe psc SLLI

**The White Hackle Editors**

Chief Consultant

Maj Gen KADA Karunasekara RSP USP ndu psc

Editor in Chief

Brig CD Weerasuriya RSP

Assistant Editors

Maj TWGDM Amarasinghe psc SLLI

Maj BGA Rupasinghe SLLI

(Officer In Charge )

Honourary Consultants

Lt Gen RMD Rathnayake WWV RWP RSP USP ndu psc

(The Commander of the Army)

Lt Gen HV Atukorale (Retd) VSV psc FBIM

(Reg Force)

Brig AER Abeyesinghe (Retd) KSV

( Vol Force)

Computer Type setting & Designed

WO II Gunasiri SHIUK

Publisher - Regimental Centre

Sri Lanka Light Infantry

Telephone- 0112855204

0112855356 - 60

Ext - 57656

Fax - 0112855204

E-mail - editor.whitehackle@gmail.com

editor.whitehackle@yahoo.com

Website - www.army/lightinfantry.lk


## Feedback

### අදහස්, උදහස් හා විවේචන
### Readers Please Write in

The **WHITE HACKLE** the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 81st issue. This quarterly is for members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of **WHITE HACKLE** depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through **" THE WHITE HACKLE "**, the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to **" THE WHITE HACKLE "** we are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is **" Ich Dien", " I Serve"**. Let **'White Hackle'** be a way to serve each other, our Regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

-Editor-

## කතුවැකිය

පහළ, සාමාන්‍ය, ඉහළ යන පන්තිවල ජීවත්වන මිනිස් සමාජයේ සියලුම දෙනා ශ්‍රේෂ්ඨ යැයි සිතනු ලබයි. අපි අපි ගැනම කොතරම් දුරට ශ්‍රේෂ්ඨ යැයි ද සිතීම ඉතාම වැදගත් කරුණකි.

ස්වාභාවික දිය දහර ඔස්සේ සයුරට ගලායන වැසි දිය රැස් කර ගන්නා වැව් ඉන්පසු ක්‍රමානුකූලව කෙත්වතු සරුසාර කිරීම සඳහා දියවර මුදාහැරීමට නිර්මාණ කරුවන් විසින් අපට දායාද කර ඇත. ශ්‍රේෂ්ඨ මිනිසුන්ගේ රැස් කිරීමත්, මුදා හැරීමත් සිදු විය යුත්තේ ද වැවක් පරිද්දෙන්ය. ජීවිත කාලය පුරා අපි විවිධ දේ රැස් කරන්නෙමු. පින් පව් යන සංකල්පය හැරුණු කොට දැනුම, ධනය හා බලයද ප්‍රධාන වශයෙන් රැස් කරන්නෙමු. රැස් කිරීමේදී පුද්ගල දක්ෂතාවය විවිධය. ඇතැමුන් දැනුම පමණක් රැස් කරද්දී සමහරු ධනය පමණක් රැස් කරයි. තව පිරිසක් ඊට අමතරව බලයද රැස් කරයි. දැනුමත්, ධනයත්, බලයත්, එක සේ රැස් කරගන්නට සමත් අයද සුළු වශයෙන් සිටිති.

පුද්ගලයෙක් ශ්‍රේෂ්ඨ වන්නේ රැස් කරගත් දැනුම අනුව නොවේ. එය මුදා හැරීමේදී අනුගමනය කළයුතු පිළිවෙත අනුවය. හුදු ආත්මාර්ථකාමීත්වයට වඩා ලෝකයේ යහපත ගැන සිතා තමන් රැස්කර ගත් දෑ බෙදාහරින්නෝ ශ්‍රේෂ්ඨයෝ වෙති.

අප රෙජිමේන්තුවද අතීතයේ සිට බෙදා හදාගත් රෙජිමේන්තුවකි. අපි සැමද ශ්‍රේෂ්ඨයෝ වෙති. එසේ වන්නේ එදා අපගේ ඉතිහාසයේ සිටි රෙජිමේන්තුවේ පැරණි සාමාජිකයින් බෙදාහැරි ශ්‍රේෂ්ඨ ක්‍රමවේදය නිසාවෙනි. ඔවුන් විවරකරදුන් මගේ ශ්‍රේෂ්ඨ විදියට ගමන් කිරීම අප සැමගේ යුතුකමකි. වගකීමකි. මෙය අප සැමට පොදු වූ කරුණකි.


The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental conference held at Welioya.

# බ්‍රිගේඩියර් නිලයට උසස්වීම් ලැබූ ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්



## බ්‍රිගේඩියර් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට කෙඩෙට් නිලධාරියකු වශයෙන් 1986 ඔක්තෝබර් මස 27 වන දින නිලධාරි බඳවා ගැනීම් අංක 26 යටතේ යුද හමුදාවට එක්වී පාකිස්ථාන යුද හමුදා විද්‍යා පීඨයෙන් මූලික පාඨමාලාව හදාරා දෙවන ලුතිතන් වරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදාවට එක් වී ඇත. එතැන් පටන් 3, 6 ශ්‍රීලපාහ ඒකකයන් හී බණ්ඩභාර නිලධාරි වශයෙන් ද, 6, 8 ශ්‍රීලපාහ ඒකකයන් හී කණ්ඩායම් නිලධාරි අණදෙන ද, දෙවන අණදෙන නිලධාරි ලෙසින් 3 සහ 4 ශ්‍රීලපාහ ඒකකයන් හී රාජකාරි කර අණදෙන නිලධාරි ලෙසින් 10 ශ්‍රීලපාහ ඒකකය මෙහයවා ඇත.

එමෙන්ම මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි ශ්‍රීලපාහ ඒකකයන්ට පමණක් සීමා නොවී තම දැනුම මඟින් රෙජිමේන්තු මධ්‍යස්ථානයට හා යුද්ධ හමුදාවට ඉතා උසස් සේවාවක් ඉටුකර ඇත. එම සේවාවන් සිදු කළ ස්ථානය ලෙසින් රෙම ශ්‍රීලපාහ ප්‍රමානි II, පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක, මානි I (පාලන), මධ්‍යස්ථාන සේනාවිධායක ලෙසද, යුද හමුදා ආයතන වශයෙන් මව්මෙඅම ප්‍රමානි II, පුහුණු අම ප්‍රමානි II (සාම සාධක), ප්‍රමානි I (සම්බන්ධීකරන) 21 සේමු, බළසේනාධිපති 532 බසේමු හා යුද හමුදා මූලස්ථානයේ සමස්ත ආරක්ෂක සම්බන්ධීකරණ නිලධාරි ලෙසින් දැනට රාජකාරි කරනු අතර, මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා නිරීක්ෂණ රාජකාරි කොන්ගෝ රාජ්‍යයේද තම සේවය ඉටුකර ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අනුපමේය රාජකාරි ඉටු කිරීම සඳහා තම දෙමාපිය අභාසය හා පාසලෙන්, සමාජයෙන් ලද දැනුමට අමතරව යුද හමුදාව තුළින් ලබාගත් දැනුම පිටුවහල් විය. යුද හමුදාව තුළදී දේශිය මෙන්ම විදේශීය පාඨමාලාවන් රැසක් හදාරා ඇත. එනම් මානව සම්පත් කලමනාකරණ පිළිබඳ ආචාර්ය උපාධිය හා මානව සම්පත් කලමනාකරණ පිළිබඳ පස්චාත් උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය, මනෝ විද්‍යා පිළිබඳ ඩිප්ලෝමාව, ගැටුම් නිරාකරණය සහ ආරක්ෂක අධ්‍යන පිළිබඳ පස්චාත් උපාධිය, (**University of Bradford - UK**), උපදේශන උසස් ඩිප්ලෝමාව, වෘත්තීය උපදේශක සේවා පිළිබඳ උපදේශක, සංඥා පාඨමාලාව, කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව, තරුණ නිලධාරි පාඨමාලාව පාකිස්ථානය, කනිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව ඉන්දියාව, එක්සත් ජාතීන්ගේ සාමසාධක පාඨමාලාව ඉරානය, පැරෂුට් පාඨමාලාව ඉන්දියාව, ඒකක අණදෙන නිලධාරි පාඨමාලාව (පාබල) බංගලාදේශය, ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරි පාඨමාලාව ඉන්දියාව, අර්බුද කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාව ( **Asia Pacific Center for security Studies - USA**) වෙතින් හදාරා ඇත.

## බ්‍රිගේඩියර් සීඩී වීරසූරිය ආර්එස්පී



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට කෙඩෙට් නිලධාරියකු වශයෙන් 1986 ඔක්තෝබර් මස 27 වන දින එක්වී මූලික කෙඩෙට් පාඨමාලාව හදාරා 1987 ජූලි මස 23 දෙවන ලුතිතන් වරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදාවට එක් වී ඇත. එතැන් පටන් 1, 3, 4, 6, 7 8, 10 යන ශ්‍රීලපාහ ඒකකයන් රාජකාරි කර ඇත. බණ්ඩ භාර නිලධාරි වශයෙන් 1 ශ්‍රීලපාහ ඒකකයේ ද, බුද්ධි නිලධාරි, කණ්ඩායම් නිලධාරි අණදෙන, විධායක අධිකාරි වශයෙන් 6 ශ්‍රීලපාහ ඒකකයේ ද, ක්‍රියා හා පුහුණු භාර නිලධාරි ලෙසින් 3, 8, 10 ශ්‍රීලපාහ ඒකකයේ ද, දෙවන අණදෙන නිලධාරි ලෙසින් 7 ශ්‍රීලපාහ හා 1 ශ්‍රීලපාහ ඒකකයේ රාජකාරි කර 4 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කරන ලදී.

එමෙන්ම මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි ශ්‍රීලපාහ ඒකකයන්ට පමණක් සීමා නොවී තම දැනුම මඟින් රෙජිමේන්තු මධ්‍යස්ථානයට හා යුද්ධ හමුදාවට ඉතා උසස් සේවාවක් ඉටුකර ඇත. එම සේවාවන් සිදු කළ ස්ථානය ලෙසින් රෙම ශ්‍රීලපාහ පුහුණුභාර නිලධාරි, මාණ්ඩලික ප්‍රධාන නිලධාරි හා වත්මන් සේනාවිධායක ලෙසද, යුද හමුදා ආයතන වශයෙන් මානි II (පාලන) 11 සේමු, මානි II (සැලසුම්) සැලසුම්අම යුද හමුදා මූලස්ථානය, ප්‍රමානි I (සම්බන්ධීකරන) 23 සේමු, කර්නල් ප්‍රමානි 58 සේමු, බළසේනාධිපති 512 බසේමු හා බළසේනාධිපති 523 බසේමු ලෙසින් රාජකාරි ඉටුකර ඇත.

යුද හමුදාව තුළ තම දැනුම වර්ධනය කර ගැනීම සඳහා ලැබූ පාඨමාලාවන් යුද හමුදාව තුළදී දේශිය මෙන්ම විදේශීය පාඨමාලාවන් රැසක් හදාරා ඇත. කමාන්ඩෝ පාඨමාලාව, කණ්ඩායම් අණදෙන්නන්ගේ පාඨමාලාව, පරිසනක පාඨමාලාව දේශිය වශයෙන් හදාරා ඇති අතර, විදේශිය හදාරන ලද මෝටාර් පාඨමාලාව ඉන්දියාව, තරුණ නිලධාරි පාඨමාලාව පාකිස්ථානය, කනිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව බංගලාදේශය, ජ්‍යෙෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව ඉන්දියාව, එක්සත් ජාතීන්ගේ සාමසාධක පාඨමාලාව බංගලාදේශය, සිවිල් යුද පාඨමාලාව (**Naval postgraduate School**) කැලිෆෝනියාව ඇමරිකාව, වෙතින් හදාරා ඇත.

## බ්‍රිගේඩියර් ඒඒඑස්පී තිලකරත්න



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට කෙඩෙට් නිලධාරියකු වශයෙන් 1986 ජුනි මස 02 වන දින එක්වී පාකිස්ථානයෙන් මූලික පාඨමාලාව හදාරා 1987 ජනවාරි මස 22 දින දෙවන ලුතිතන් වරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදාවට එක් වී ඇත. එතැන් පටන් 3 ශ්‍රීලපාහ ඒකකයේ බණ්ඩභාර නිලධාරි වශයෙන් ද, 7 ශ්‍රීලපාහ ඒකකයේ කණ්ඩායම් නිලධාරි අණදෙන හා දෙවන අණදෙන නිලධාරි ලෙසින් රාජකාරි කර අණදෙන නිලධාරි ලෙසින් 6 ශ්‍රීලපාහ ඒකකය මෙහයවා ඇත.

එමෙන්ම මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි ශ්‍රීලපාහ ඒකකයන්ට පමණක් සීමා නොවී තම දැනුම මඟින් රෙජිමේන්තු මධ්‍යස්ථානයට හා යුද්ධ හමුදාවට ඉතා උසස් සේවාවක් ඉටුකර ඇත. එම සේවාවන් සිදු කළ ස්ථානය ලෙසින් රෙම ශ්‍රීලපාහ නිලධාරි අණදෙන (පාලන) හා මානි II (භකාස) වශයෙන් ද, යුද හමුදා ආයතන වශයෙන් ප්‍රමානි III (ක්‍රියාන්විත හා පුහුණු) 11 සේමු, පාලන නිලධාරි මූලික රෝහල (පනාගොඩ), ප්‍රමානි III 1 කාර්ය සේනාංක මූලස්ථානය - යාපනය, ප්‍රමානි II 211 බසේමු, මානි II (පාලන) 11 සේමු, ප්‍රමානි I ප්‍රමාශා යුහමු, බළසේනාධිපති 223 බසේමු, බළසේනාධිපති 621 බසේමු,බළසේනාධිපති 234 බසේමු, බළසේනාධිපති 231 බසේමු, හා 533 බසේමු බළසේනාධිපති ලෙසින් දැනට රාජකාරි කරනු ලබයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අනුපමේය රාජකාරි ඉටුකිරීම සඳහා තම දෙමාපිය අභාසය හා පාසලෙන්, සමාජයෙන් ලද දැනුමට අමතරව යුද හමුදාව තුළින් ලබාගත් දැනුම පිටුවහල් විය. යුද හමුදාව තුළදී දේශීය හා විදේශීය පාඨමාලාවන් රැසක් හදාරා ඇත. මූලික කෙඩෙට් නිලධාරි පාකිස්ථානය, තරුණ නිලධාරි පාඨමාලාව ඉන්දියාව, කනිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව ඉන්දියාව, ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරි පාඨමාලාව ඉන්දියාව ආරක්ෂක කළමනාකරණ පාඨමාලාව ඉන්දියාව, සාමසාධක බළඇණි අණදෙන පාඨමාලාව බංගලදේශය වෙතින් හදාරා ඇත. දේශිය පාඨමාලාවන් ලෙස උපදේශ ක්‍රමවේද පිළිබඳ පාඨමාලාව, ක්ෂේත්‍ර මාණ්ඩලික නිලධාරි පාඨමාලාව, මාණ්ඩලික නිලධාරි පරිසනක පාඨමාලාව, උසස් යුද තාක්ෂණය පිළිබඳ පාඨමාලාව, තේරුම් ගැනීමේ හා දරා ගැනීම පිළිබඳ කළමනාකරණ වැඩමුලුව යන පාඨමාලාවන් සාර්ථකව හදාරා ඇත.





# නාගරික සංවර්ධන හා ආරක්ෂක අමාත්‍යාංශ සේවාවනිතා ශාඛාවෙන් රණවිරුවකුට සෙවණක්





නාගරික සංවර්ධන හා ආරක්ෂක අමාත්‍යාංශ සේවාවනිතා ශාඛාවේ මූල්‍ය දායකත්වය යටතේ ඉදි කෙරුණු **"අපි වෙනුවෙන් අපි"** නිවාස ව්‍යාපෘතිය යටතේ තවත් නිවසක් 2014 ජූලි මස 15 වන දින ආබාධිත රණවිරුවෙකු හට ලබාදෙන ලදී. මෙම නිවස 10 ශ්‍රීලපාහ ඒකකය සමඟින් රාජකාරි කරමින් සිටියදී රුදුරු ත්‍රස්තවාදී ප්‍රහාරකට ලක්වී ආබාධිත වූ දූනට රෙජිමූබ ශ්‍රීලපාහ සමඟින් රාජකාරි කරනු ලබන සෙ/323124 ලාකෝ ධනංජය ඒඑම් යන රණවිරුවා හට ලබාදෙන ලදී. මෙම සුවිශේෂී පුණ්‍යකර්මය නාගරික සංවර්ධන හා ආරක්ෂක අමාත්‍යාංශ සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි අයෝමා රාජපක්ෂ මැතිනියගේ සුරතින් සිදු කළ අතර, යුද හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනිය දමයන්ති රත්නායක මැතිනිය හා ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුලු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගි වන ලදී.





# THE DEATH OF BRIGADIER M.M. KULATUNGE IS ANNOUNCED WITH DEEPEST CONDOLENCE



Mahindrasiri Mahindralal Kulatunge was born on 12 October 1955 to parents, Mr R R G Kulatunge who was a Principal and Mrs Prema Kulatunge of Kahawatta, Pelmadulla in Rathnapura District.

He joined the Sri Lanka Cadet Corps on 01 April 1983 and was absorbed to the Sri Lanka Army Volunteer Force on 01 June 1987 and posted to the Second Volunteer Battalion of Sri Lanka Light Infantry. Being an Officer of Sri Lanka Light Infantry, he had the privilege of holding the appointments such as Adjutant from 1994 to 1997, Second in Command in 1997 and the Commanding Officer from 1997 to 1999 of the 4th Sri Lanka National Guards and 2000 to 2006 of the Second Volunteer Battalion of Sri Lanka Light Infantry.

Subsequently, he held the appointments of Colonel Coordinating Officer at Area Headquarters (Mannar) from 2006 to 2007, Colonel Coordinating Officer at Security Force Headquarters (Jaffna) in 2007, Colonel Administration at Headquarters of the Sri Lanka Army Volunteer Force from 2007 to 2010, Colonel Coordinating Officer at Security Force Headquarters (Wanni) from 2010 to 2012, Brigadier Administration at Headquarters of the Sri Lanka Army Volunteer Force in 2012 and Colonel of the Regiment of Sri Lanka National Guard from 2012 to 2014.

In recognition of his efficiency, loyalty and dedicated service, Brigadier Kulatunge was decorated with the following medals during his long and distinguished military career:

a. East Humanitarian Operations Medal
b. North Humanitarian Operations Medal
c. Purna Bhumi Padakkama.
d. North and East Operations Medal
e. Riviresa Campaign service Medal
f. 50th Independence Anniversary Medal
g. The Republic of Sri Lanka Army 50th Anniversary Medal
h. Sri Lanka Armed Services Long Service Medal

He leaves behind his beloved wife Mrs Jinani Kulatunge and the loving son Akila and daughter Onila. The demise of Brigadier M M Kulatunge, a thorough gentleman is an irreparable loss not only to Mrs Jinani Kulatunge, his son Akila and daughter Onila, but also to all of his relations, friends and his contemporaries in the armed services.







# 25 ශ්‍රීලපාහ පුවත්

## නව අණදෙන නිලධාරී

ශ්‍රී ලංකා පාබල රෙජිමේන්තුවේ 25 වන බළඇණිය බිහිවී වසර 5 ක ඉතිහාසයකට උරුමකම් කියනු ලබයි. මෙම බළඇණිය ස්ථාපිත කිරීමේ සිට නායකත්වය ලබාදුන් සියලුම අණදෙන නිලධාරිවරුන් හා ජ්‍යෂ්ඨ නිලධාරීන්ගේ දැඩි කැපවීම හා අධිෂ්ඨානය තුළින් පාබල රෙජිමේන්තුවේ ඒකකයන් අතරින් දීප්තිමත් ඒකකයක් ලෙස කිරුළ පැළඳවීමට විශාල වෙහෙසක් දැරූහ.

මෙම ඒකකයේ කෙවන අණදෙන නිලධාරි වශයෙන් කටයුතු කළ ලුතිතන් කර්නල් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ වසර දෙකහමාරකට අධික කාලයක් ඒකකයේ රාජකාරි සිදු කර 2014 ජූලි මස 09 වන දින අණදෙන නිලධාරි තනතුර මේජර් ආර්ජ් සමරනායක පීඑස්සී ශ්‍රීලපාහ වෙත භාරදී 25 ශ්‍රීලපාහ ඒකකයෙන් සමුගන්නට යෙදුණි. එම අවස්ථාව නිලධාරින් ඇතුලු සියලුම සෙසුනිලයින් හට ඉතාමත් හැගුම්බර මොහොතක් වූහ. එතුමන් විසින් මෙම බළඇණිය ප්‍රතිස්ථාපනය කිරීම හා රජය මගින් ක්‍රියාත්මක කර ඇති අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාදාමය සඳහා කළ සේවය මෙම මොහොතේදී කෘතවේදිව සිහිපත් කරන්නෙමු.




නව අණදෙන නිලධාරි වෙත කඳවුරු සම්මාන මුරයක් ලබා දී පිළිගැනීම 2014 ජූලි මස 09 වන දින සිදු කළේය. එදින 0915 පැයට යෙදුන සුබ මොහොතින් ආගමික වතාවත් සිදු කොට සාම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන් දල්වා රාජකාරි භාරගැනීම සිදු කරන ලදී. මෙම අවස්ථාව බළඇණියේ සියලුම නිලධාරින් හා ජ්‍යෙකොනොනින් ද සහභාගිවන ලදී. ඉන් පසු ඒකක භටපිරිස් ඇමතූ මුල්ම අවස්ථාවේදී නව අණදෙන නිලධාරි විශේෂයෙන් ප්‍රකාශ කර සිටියේ අද දිනයට නියමි රාජකාරි අද දිනම ඉටු කිරීමටත්, තම තමන්ගේ රාජකාරි නිවැරදිව නිසි ආකාරයෙන් ඉටු කරන ලෙසත්, එතුමන් අදහස් පැහැදිලි කළේය.

නව අණදෙන නිලධාරිගේ වසර 21 වූ තම සේවා කාලය තුළ කණිෂ්ඨ හා ජ්‍යෂ්ඨ නිලධාරියෙකු වශයෙන් හෙබවිය යුතු තනතුරු හොබවා විවිධ පාඨමාලා හදාරමින් විශේෂයෙන් විදෙස් පාඨමාලා හදාරා ක්‍රියාන්විත පාලන හා පුහුණු යන අංශ සම්බන්ධයෙන් මනා දැනුමක් ඇති අත්දැකීම් සම්භාරයකින් සමන්විත නිලධාරියෙකු වේ. එමෙන්ම දැනුම වෘත්තීය නිපුණත්වය තුළින් ඒකකයේ ආරම්භක නිර්මාතෘවරුන්ගේ අභිලාෂයන් ඉටු කරමින් ශ්‍රී ලංකා පාබල හමුදාවේ අභිලාෂයන් මුදුන්පත් කර සමස්ත යුද හමුදාව තුළ 25 වන පාබල හමුදාව දීප්තිමත් බළඇණියක් බවට පත් කරනු ඇතැයි යන්න අපගේ අපේක්ෂාවයි. අණදෙන නිලධාරි තනතුර දක්වා එතුමන් පැමිණි ගමන් මග තුළින් අපහට ලබා ගත හැක්කේ උසස් ආදර්ශයකි. එතුමන්ගේ අපේක්ෂාව වනුයේ මෙම බළඇණිය පාබල හමුදා ඒකක අතර, පුහුණු පාලන හා ක්‍රීඩා යන අංශයන්ගෙන් කැපී පෙනෙන ඒකකයක් බවට පත් කිරීමය. එම අභිලාෂය මුදුන්පත් කර ගැනීම සඳහා ඒකකයට අයත් සියලුම නිලධාරි සෙසුනිලයින් දායකත්වය ලබා දෙනු ලබන අතර, එම පරමාර්ථයන් අරමුණ කරා ගමන් ගැනීමට එතුමන් හට අවැසි ශක්තිය ධෛර්යය ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය දළඳා සමිඳුන්ගේ රැකවරණය ලැබේවායි අප නිරතුරුවම ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි නිලධාරි - 25 ශ්‍රීලපාහ**



## මිනිසත් කම



නිල තල තාවකාලිකය
මනුෂ්‍ය කම සදාකාලිකය
තාවකාලික පැවතුම් හට
සදාකාලිකත්වය යටපත් කළ හැකි නම්
අරුත් කියනු නුඹේ හදවතට හිමි

මනුසයෙකු වී ඉපිද
මනුසයෙකු ලෙසින් මියැදෙන කළ
කුමට හැසිරෙනු තරම් නොමවිනා
තිරිසන් ගති මනු ලොවේ...

මේජර් ඒඑල්කේ ලියනගේ ශ්‍රීලපාහ
12 ශ්‍රීලපාහ

# 10 ශ්‍රීලපාහ පුවත්

## ප්‍රජා සත්කාර




මේ දිනවල ප්‍රදේශයේ පවතින දැඩි නියං තත්ත්වය හමුවේ මල්ලාවි ප්‍රදේශයේ දමිළ ජනතාවට ජලය නොමැතිව අපහසුතාවයකට පත්ව සිටින අවස්ථාවක එයට පිලියමක් වශයෙන් ප්‍රජා සත්කාරයක් 10 ශ්‍රීලපාහ ඒකකය විසින් සිදු කරන ලදී. ඒකක අණදෙන නිලධාරි ගේ මග පෙන්වීම මත ප්‍රදේශයේ දමිළ ජනයා වෙත බවුසර් මගින් ජලය බෙදා දීම සිදුකරන ලදී.

## මියගිය/ආතුරැදුහන් රණවිරුවන් සිහිකිරීම

නිකිණි පුන් පොහොය දින වූ 2014 අගෝස්තු මස 10 වන දින 10 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි ගේ සංකල්පයකට අනුව පුණ්‍ය කර්මයක් සිදු කිරීමට ඉත්තැපානේ ඥාණසාර හිමියන් ඒකකය ස්ථානගත පාලිනගර් කඳවුර වෙත වැඩමකරවා මියගිය රණවිරුවන් හට පිං අනුමෝදනා කිරිමත්, සේවයේ යෙදී සිටින සියලුම නි/සෙසුනිලයින් හට සෙත්පැතිමත් අරමුණු කරගෙන ආගමික වතාවත් සිදු කරන ලදි. දක්ෂ කථිකයෙකු වූ උන්වහන්සේ යුද ඉතිහාසය ඇතුළත් සෙබළ ජීවිතය සාර්ථක කරගන්නා ආකාරය පිළිබඳව එදින 1600 පැයේ සිට 1800 පැය දක්වා ඉතා කාලෝචිත ධර්ම දේශනාවක් පවත්වන ලදි. ඒ අනුව එම ධර්ම දේශනාව අවසානයේ බළඇණියේ සියලුම නිලධාරි/සෙනින්ගේ දායකත්වයෙන් අටපිරිකරක් සහ සෙසු පිරිකර පූජා කළ අතර, මෙම ආගමික වතාවත් සඳහා නිලධාරි හා සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි විය.

**බුද්ධි අංශය - 10 ශ්‍රීලපාහ**





## ගවයෙකුට අභයදානයේ



# 4 ශ්‍රීලපාහ පුවත්

ලෝතලය මත ජීවත්වීමේ අයිතිය සිටිනා සියලුම සත්වයන්ට පොදු අයිතියකි. කෘෂි කාර්මික රාජ්‍යයක් වන ශ්‍රී ලංකාවේ ගවයා යනු විශාල සම්පතකි. එවන් සම්පතක් රැකගැනීම අප සියලුම දෙනාගේ වගකීමකි. මුදලට ගිජු සමාජයේ ගවයා මස් පිණිස අලෙවි කිරීම තුළින් මහත් වූ සම්පතක් අපට අහිමි වෙමින් පවති. ගව සම්පත අහිමි කිරීම අපරාධයකි. පාප කර්මයකි.

2014 සැප්තැම්බර් මස 14 දින 4 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි සහ අනිකුත් නිලධාරීන්ගේ මූල්‍යමය ආධාර මඟින් මස් පිණිස අලෙවි කිරීමට ගිය ගවයෙකු හට අභය දානය ලබාදී විශාල පුන්‍යකර්මයක් සිදු කර ගන්නා ලදී.

# ශ්‍රීලපාහ පුවත්





## විරුවන් සමරමින්

1983 ජූලි මස 23 වන දින එල්ටීටීඊ සංවිධානය විසින් ඊළාම් ත්‍රස්තවාදය ආරම්භය සනිටුහන් කරමින් යාපනය තිරුණෙල්වේලි ප්‍රදේශයේ පාමුර සංචාරයක යෙදී සිටි ලුතිනන් වාස් ගුණවර්ධන ඇතුලු වීරෝදාර රණවිරුවන් 12 දෙනෙකුගේ ජීවිත අහිමි කරමින් ප්‍රහාරයක් එල්ල කරන ලදී. තිරුනෙල්වේලි ප්‍රහාරයට වසර 31 සපිරීම නිමිත්තෙන් 2014.07.23 සහ 2014.07.24 වන දිනයන් වලදී ශ්‍රී දළදා මාළිගාවේ පිංකම් ප්‍රථම වරට 1 ශ්‍රීලපාහ ඒකකය විසින් සිදු කරන ලදී.

ඒකක අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් 23 වන දින සවස ගිලන්පස පූජාවක් සහ පසුදින දළදා වහන්සේ වෙත හා ශ්‍යාමෝපාලී මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ මහා නායක අතිපූජ්‍ය අග්‍රමහා පණ්ඩිත උඩුගම සද්ධර්ම කීර්ති ශ්‍රී ධම්මදස්සි රතනපාල බුද්ධරක්ඛිතාදිධාන මහා නායක ස්වාමීන් වහන්සේ ඇතුලු මහා සංඝයාවහන්සේලා වෙත දහවල් දානය පිළිගන්වන ලදී.

ශ්‍රී ලංකාද්වීපයේ ස්වෛරීභාවය වෙනුවෙන් දිවිදුන් සියලුම රණවිරුවන්ට පිං අනුමෝදන් කරවීමත්, ආබාධිත රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමත්, දැනට ඒකකය සමඟින් රාජකාරි නියුතු සියලුම අයවලුන්ට හා වත්මන් යුද්ධ හමුදාධිපති, රෙජිමේන්තු අධිපති තුමන්ලා ඇතුලු සියලුම විරුවන්ට ආශිර්වාද ලබා ගැනීමත් සිදු කරන ලදී.



නි/64919 මේජර් ඩීකේ කලුවාදේව ආර්එස්පී ශ්‍රීලපාහ

## රෙජිමේන්තුව බබලවන පාබල නිලධාරීන්

කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව අංක 22 යුද හමුදා විද්‍යා පීඨය දියතලාව වෙතින් 2014.01.06 වන දින සිට 2014.04.22 දින දක්වා පවත්වන ලදී. එම පාඨමාලාව සඳහා සියලුම රෙජිමේන්තු වෙතින් නිලධාරීන් 34 දෙනෙකු සහභාගී වූහ. ශ්‍රීලපාහ රෙජිමේන්තුව නියෝජනය කරමින් නි/64919 මේජර් ඩීකේ කලුවාදේව ආර්එස්පී ශ්‍රීලපාහ සහභාගි විය. පාඨමාලාව හැදෑරූ සියලුම නිලධාරීන් අභිබවා මේජර් ඩීකේ කලුවාදේව ආර්එස්පී ශ්‍රීලපාහ විසින් ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා ලදී. පාඨමාලාවෙන් දස්කම් දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෙජිමේන්තු අතුරින් ශ්‍රී ලංකා පාබල පාබල හමුදා රෙජිමේන්තුවට හා 1 ශ්‍රීලපාහ ඒකකයට කීර්තියක් ලබාදුන් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත අප සැම සුබ පතන්නෙමු. ඉදිරියේදීද මෙවැනි ජයග්‍රහණ ලබා ගැනීමට ඒකකයට හා රෙජිමේන්තුවට අභිමානයක් ගෙන ඒමට වාසනාව, ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.



නි/65946 මේජර් ඒඑස් රාජරත්න ආර්එස්පී ශ්‍රීලපාහ විසින් සම්මාන ලබාගනිමින්

තරුණ නිලධාරී පාඨමාලාව අංක 132 ඉන්දියාවේදී 2013.12.09 වන දින සිට 2014.04.26 දින දක්වා පවත්වන ලදී. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ත්‍රිවිධ හමුදා නිලධාරීන් 38 දෙනෙකු (යුද හමුදා නිලධාරීන් 31, නාවික හමුදා නිලධාරීන් 05, ගුවන් හමුදා නිලධාරීන් 02) සහභාගි විය. විදේශීය හමුදාවන් වෙතින් නිලධාරීන් 06 දෙනෙකුද (ඇෆ්ගනිස්ථාන් යුද හමුදා නිලධාරීන් 04, ඉතියෝපියානු යුද හමුදා නිලධාරීන් 02) සහභාගි විය. පාඨමාලාව ඉතා සාර්ථකව හදාරා දෙස්විදෙස් යුද හමුදා නිලධාරීන් 42 දෙදෙනකු අතුරින් හොදම ව්‍යාපෘති වාර්තාව ලෙස "CRIMEAN CRISIS AND RUSSIAN INVOLVEMENT" ඉදිරිපත් කළ 1 ශ්‍රීලපාහ ඒකකයේ නි/65946 මේජර් ඒඑස් රාජරත්න ආර්එස්පී ශ්‍රීලපාහ ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා ලදී. පාඨමාලාවෙන් දස්කම් දක්වා ශ්‍රී ලංකාවට, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට, ශ්‍රී ලංකා පාබල හමුදාවට හා 1 ශ්‍රීලපාහ ඒකකයට කීර්තියක් ලබාදුන් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත අප සැම සුබ පතන්නෙමු. ඉදිරියේදීද මෙවැනි ජයග්‍රහණ ලබා ගැනීමට ඒකකයට හා රෙජිමේන්තුවට අභිමානයක් ගෙන ඒමට වාසනාව, ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

# 26 ශ්‍රීලපාහ පුවත්

## බළඇණි පුහුණුවීම්



මෙම ඒකකය දෙවන අධියර යටතේ බළඇණියේ සියලුම දෙනාගේ සාමුහිකත්වය ගොඩනැංවීම හා දැනුම වර්ධනය කිරීම සඳහා පුරා දින තිස් හයක සාර්ථක බළඇණි පුහුණුවක් ලැබීමට අවස්ථාවක් උදාවිය. ඒකක අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ජීජ්ඩීකේජී ගනේගොඩ ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ විසින් පුහුණුවීම් කටයුතු සුපරික්ෂාකාරිව සොයාබලා පුහුණුවීම් සඳහා ඇවැසි සියලු කටයුතු සුදානම් කරන ලදී. 2014.07.01 වන දින පුහුණුවීම් කටයුතු ආරම්භ කරමින් 61 වන සේනාංකාධිපති බ්‍රිගේඩිය ඩීඑම්ඩබ්ඩබ්ඩබ්එම්ආර්එම්ආර්එම් දවුලගල ආර්එස්පී විසින් ආරම්භක දේශනය සිදු කරන ලදී. 2014.08.08 වන දින පුහුණුවීම්වල වැදගත්කම විදහා දක්වමින් ඒකකයේ නිලධාරි/සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් සරඹ සංදර්ශනයක් පවත්වා පුහුණුවීම් සාර්ථකව අවසන් කරන ලදී.





## සිව්වන බළඇණි දිනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ ළාබාලතම සාමාජිකයා වන මෙම බළඇණියේ සිව්වන සංවත්සරය 2014.09.20 වන දිනසමරණ ලදී. සංවත්සර දිනය ඉතා චාම් ලෙසින් සංවිධානය කර තිබුණි. ඒ අනුව ආගමික වතාවත් වලට මුල් තැන දෙමින් ආගමික කටයුතු සිදු කරන ලදී. ඒකක අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ජීජ්ඩීකේජී ගනේගොඩ ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ වෙත සම්මාන මුරයක් ලබාදී ඉන් අනතුරුව රුක් රෝපන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඒකකයේ කණ්ඩායම් අතර තරගකාරිත්වයක් ඇති කිරීම සඳහා වොලිබෝල් තරගාවලියක් පැවැත්වීම සිදු කරන ලදී. 7 ශ්‍රීලපාහ අධිරිද්ම සංගිත කණ්ඩායමේ තත්සර නදින් සංගීත ප්‍රසංගයක් පවත්වා සියලුම අයවලුන්ට විනෝදාස්වාදයක් ලබාදෙන ලදී.







# ජෝසප්ඩ් පුරවැසි රණවිරුවන් සමඟින්

ශ්‍රී ලංකා මාතාවගේ ස්වෛරීභාවය වෙනුවෙන් තම යොවුන් ජීවිතය කැපකොට වයෝවෘද්ධ විශ්‍රාමික සේවා මුක්ත භට සංගම් ප්‍රවීණ රණවිරු නිවාසය කටාන හී නේවාසිකව වාසය කරන රණවිරුවන් උදෙසා 2014.07.04 වන දින ආහාර පාන ලබාදීම මෙම ඒකකය වෙතින් සිදු කරන්නට යෙදුණි.

ඒකකය වෙත පැවැරෙන රාජකාරි මධ්‍යයේ වුවද මෙවන් ස්ථානය වෙත ඒකක උපකරණ පාලක නිලධාරි සහ රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු පිරිසක් සහභාගි කරවීමට

# 8 ශ්‍රීලපාහ පුවත්

ඒකක අණදෙන නිලධාරි කටයුතු කරන ලදී.

මෙම අවස්ථාව සඳහා ඒකකයේ කැලිප්සෝ සංගීත කණ්ඩායම රණවිරු නිවාසයේ නේවාසිකව සිටින මෙම උදාර රණවිරුවන්ගේ තරුණ්‍ය සිහිපත් කර ඒ සොඳුරු කාලය ආවර්ජණය කරවීමට අවස්ථාවක් උදාකර දෙන ලදී. මෙහිදි ඔවුන් පැණනැගි ඇති ගැටලු අප හමුවේ ඉදිරිපත් කළහ.







# පාබල තරුවක්

තම සේවා කාලය තුළ ක්‍රීඩා ක්ෂේත්‍රයෙහි නියලි ජයග්‍රහණ රාශියක් හිමිකර ගත් 2 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ සෙ/2ඩී01530 කෝප්‍රල් මෙන්ඩිස් කේඩීඩබ්ලිව් පාබල ක්‍රීඩා තරුවකි. 2014 ජුනි මස 14 සහ 15 යන දිනයන් හීදී දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩාංගනයේදී පැවති 2014 ප්‍රවීනයන්ගේ මලල ක්‍රීඩා තරඟාවලියේදී රන් පදක්කම් දෙකක් දිනා ගන්නා ලදී. එහිදී මීටර් 100 හා දුර පැනීම ඉසව් ඔහු විසින් නියෝජනය කර ඇත. එමෙන්ම ජාතික තරඟයන්ට මෙන්ම විදේශීය තරඟ සඳහා ඉදිරිපත් වී ජයග්‍රහණ රැසක් හිමිකරගෙන ඇත. මෙම ජයග්‍රහණ පසුපස සිට දිරිගන්වන්නන් අතුරින් ඉදිරියෙන්ම සිටිනු ලබන්නේ බ්‍රිගේඩියර් එම්එම් කුලතුංග, මේජර් ජීඩබ්ලිව්ජ්එන්එස්කේ වීරසිංහ ශ්‍රීලපාහ හා යුද හමුදා මලල ක්‍රීඩා පුහුණුකරු කෝප්‍රල් කුමාරසිංහ හා ඒකකයේ සියලුම නිලධාරින් හා සෙසුනිලයින්ය. මෙවන් ජයග්‍රහණ ලබාගනිමින් ඒකකයට, රෙජිමේන්තුවට හා යුද හමුදාවට අභිමානයක් වන ඔබට අප සැම එකසිතින් සුබ ප්‍රාර්තනය කරන්නෙමු.

**ලුතිතන් ජේජ් මිහිර ශාන්ත ශ්‍රීලපාහ**
**විධායක අධිකාරි - 2(සෙව්) ශ්‍රීලපාහ**

# සාමයේ පණිවුඩය

*ඉන්දියන් සාගරේ - මුතු ඇටය රමණිය*
*දහම් දිවයින අපේ- ලෝ පතල වුනි මෙලෙස*

*තිලෝගුරු බුදු හිමිගෙ - උතුම් පා පහස ලැබු*
*මේ අනගි පින් කෙතේ - ඉපදුමත් වාසනා*

*පන්සලයි දාගැබයි - වැවයි ,රන්වන් කෙතයි*
*උදාර වු සිංහලේ - අභිමාන බව කියයි*

*විර දම්පල් තුමා - සුමංගල හිමිපාණෝ*
*දැයේ දියුණට එදා - කැපකලේ මුළු දිවිය*

*අපේ රට, අපේ දැය - අපේ යන සිතුවිල්ල*
*මුතුන් මිත්තන්ගේ අපේ - තිබුණි සිත් සතන්වල*

*උදාර වු හෙළ බිමේ - පතා නිදහස එදා*
*ලය පැහැවි එඩිතරව - නොරටුන්ගෙ උණ්ඩයට*

*අහෝ මගෙ මව් බිමේ - තිබු එදා ජීවයට*
*විනකලේ කවුරුන් ද - බලලෝබීන් වල්මත්ව*

*ජාතියේ මල් කැකුළු - අකාලයේ මිලින වන*
*දැයක් ගොඩ නැගෙව්ද - වැළලුනොත් මේ විලස*

*මගේ පුත මගේ දුව - දුරැර දැදම් ගේද,*
*දල්වන්න එක් සිත්ව - සාමයේ පහන් සිල*

*උපන් තම මව්බිමට - අමිල සුන්දර දිවිය*
*කැප කෙරු විරු පුතුනි - පුදමි කවි මල් කළඹ*
*විරයිනි නුඹ සැමට...*

සාරා මාලනි යාපා - මේජර් දසනායකගේ මැණියන්

# 10 ශ්‍රීලපාහ පුවත්

## ප්‍රජා සත්කාර

මෙම ඒකක 'බී' කණ්ඩායම් භටපිරිස් මල්ලාවි නගරයේ ස්ථානගතව රාජකාරීන් සිදු කරමින් සිටින අතරතුර 2014 අගෝස්තු මස 10 වන දින 1145 පැයට පමණ මල්ලාවි නගරයේ වෙළඳ සැලක් විදුලි කාන්දුවීමක් හේතුවෙන් ගින්නක් ඇති වී තිබුණි. ලද තොරතුරකට අනුව ක්ෂණිකව ක්‍රියාත්මක වූ භටපිරිස් එම ස්ථානයට ගොස් ප්‍රදේශයේ සිවිල් ජනතාව සමගින් උරෙන් උර ගැටී ඇවිලෙමින් තිබූ ගින්න නිවීම සඳහා ක්‍රියාත්මක වන ලදී. ක්ෂනිකව ක්‍රියාත්මක වූ ඒකකයේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් කේඩීඑල්සී විජේනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් අතිරේක භටපිරිස් එම ස්ථානයට පිටත්කර 653 බළසේනා මූලස්ථානයේද සහය ඇතිව ගින්න මැඩපැවැත්වීමට කටයුතු කරන ලදී. මෙම ගින්න පැතිරියාම වැලැක්වීමට කටයුතු කිරීම හේතුවෙන් ඒ අසල තිබූ අනෙකුත් වෙළඳසැල් වලටද සිදු වන්නට තිබූ විශාල විනාශය වලක්වාලීමට කටයුතු කරන ලදී.

තිස් වසරක යුද්ධය නිමාවත් සමග ගෙවීගිය වසර 05 ක කාලය තුළ යුද්ධ හමුදාව හා සිවිල් ජනතාව අතර සුහදත්වය වර්ධනය කිරීම වස් විවිධාකාර ප්‍රජා සත්කාර යුද්ධ හමුදාව විසින් සිදු කළද, පසුගිය කාලයේ ජාතික හා ජාත්‍යාන්තරව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානි කිරීමට උත්සාහ දරණ මෙවන් අවධියක මෙවැනි හදිසි ආපදාවන්ට ලක්වන සිවිල් වැසියන් හට සිදු කරන මෙහෙවර යුද්ධ හමුදාවේ ගෞරවයට හා කීර්තිනාමයට මහත් පිටුවහලක් වනු ඇත. මෙම මහගු කාර්ය වෙනුවෙන් ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තුමාගේ හා අනෙකුත් ප්‍රභූවරුන් ඇතුළු සිවිල් වැසියන්ගේ මහත් පැසසුමට ලක්විය.

සිවිල් ජනතාවගේ ජන ජීවිතය ගොඩ නැගීම සඳහා මෙවැනි ප්‍රජාසත්කාර ඉදිරියටත් සිදු කිරීමට 10 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ඇතුළු සියලුම භටපිරිස් හට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.





## ඒකකයේ අතරේ සුහදත්වය වර්ධනය කිරීම

653 බළසේනාවට අනියුක්තව පාලිනගර්, මල්ලාවි ප්‍රදේශයේ ස්ථානගතව 10 ශ්‍රීලපාහ ඒකකය රාජකාරී කරනු ලබයි. මෙම බළසේනාධිපති බ්‍රිගේඩියර් එම්ඩී විජේසුන්දර ආර්එස්පී ගේ සංකල්පයකට අනුව බසේමු හා ඒකකයන් අතර, සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රීඩා තරගාවලියක් පවත්වන ලදී. එහිදී වොලිබෝල් තරගාවලිය මෙම ඒකකය වෙතින් සංවිධානය කරනු ලැබීය. ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් කේඩීඑල්සී විජේනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ මගපෙන්වීම හා පූර්ණ අධීක්ෂණය යටතේ 2014.08.17 වන දින ඒකක ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී. එහිදී 653 බසේමු, 21 (සේවා) ශ්‍රීලපාහ හා 10 ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායම් තරග වැදුනි. මෙම ඒකක කණ්ඩායම ඒකකයට ඉමහත් කීර්තියක් සහ අභිමාණයක් ගෙන දෙමින් 2014 වර්ෂයේ සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් පවත්වන ලද වොලිබෝල් තරගාවලියෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගන්නා ලදී.



බළඇණි මූලස්ථානය 10 ශ්‍රීලපාහ

# රණවිරුවකුගේ හිසට සෙවනක්

## සේවා වනිතා විත්ති



ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ප්‍රජා සත්කාර අතරේ නිවාස අහිමි රණවිරුවන් වෙත නිවාස ඉදිකර දීමේ ව්‍යාපෘතියේ තවත් නිවසක් ලබාදෙන ලදී. ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ මූල්‍ය අනුග්‍රහයෙන් හා ශ්‍රී ලංකා පාබල හමුදා මූලස්ථාන බළඇණිය ශ්‍රම දායකත්වයෙන් දෙපානම, පන්නිපිටිය ප්‍රදේශයේ ඉදිකර ලද නව නිවහන 2014.09.05 දින 9 (සේවා) ශ්‍රීලපාහ ඒකකයේ සෙ/9ඩී00803 ලාකෝ පීරිස් කේ වෙත ලබාදෙන ලදී. මෙම නිවස ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි ධනංජනී කරුණාසේකර මැතිනියගේ ආරාධනයෙන් යුද හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනියගේ සුරතින් විවෘත කරන ලදී.

මෙම සුවිශේෂී අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුද සේවා ලේකම් හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීජී කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේනාවිධායක ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරින් මෙන්ම පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ සෙසු සාමාජිකාවන් මෙම අවස්ථාවට සහභාගි වූහ.







## සේවා වනිතාවන්ගේ සුහද හමුව

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනිය හා සෙසු සාමාජිකාවන් විසින් දිගන වික්ටෝරියා පාර්ක් හෝටලයේ සුහද හමුවක් 2014 සැප්තැම්බර් මස 06 දින පවත්වන ලදී. එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ අතීත සභාපතිනියන් හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවාවනිතා ශාඛාවේ වත්මන් ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනිය ද සහභාගි වූහ.





# මාසික සභාවාරය





ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ මාසික සභාවාරය ගරු සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් සාමාජිකාවන් විශාල පිරිසකගේ සහාගීත්වයෙන් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී 2014 ජුනි මස 29 වන දින පැවත් වූහ. මෙම සභා වාරයෙන් පසු රෙජිමූබ ශ්‍රීලපාහ සෙ/303470 කෝප්‍රල් සමන් කුමාර වයිආර් යන ආබාධිත රණවිරුවාගේ සුබවිහරණයට සනීපාරක්‍ෂක කට්ටලයක් පරිත්‍යාග කරන ලදී.



# සේවාවනිතාවන්ගේ අනගිත සැමටම

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් මියගිය අතුරුදහන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ට මෙන්ම ආබාධිත හා සේවයේ යෙදී සිටින රණවිරුවන් වෙනුවෙන් වෛද්‍යාධාර, නිවාස ආධාර හා පරිත්‍යාග භාණ්ඩ ලබාදීමේ පුණ්‍යකර්ම උත්සවයක් 2014.08.24 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශණ ශාලාවේදී පවත් වන ලදී.

මෙම උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමන් සහභාගි විය. එසේම ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි ධනංජනී කරුණාසේකර මැතිනිය, සෙසු සාමාජිකාවන් විශාල පිරිසක් ද පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේනාවිධායක තුමන් ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද මෙම අවස්ථාවට සහභාගි විය.

මෙහිදි මියගිය රණවිරුවකුගේ මවක් වෙත හා රෙජිමේන්තුවේ සිවිල් සේවක මහතකු වෙත වෛද්‍යාධාර මුදල් පරිත්‍යාග කළ අතර, රණවිරුවන් දහතුන්දෙනෙකු වෙත හා මියගිය රණවිරුවෙකුගේ මවක් වෙත නිවාස ආධාර ප්‍රදානය කරන ලදී. ආබාධිත රණවිරුවන් අටදෙනෙකු වෙත නානකාමර කට්ටලය බැගින් හා තවත් රණවිරුවන් දෙදෙනෙකු වෙත අත්වාරු යුගලයක් හා ඇවිදීමේ උපකරණයක් පරිත්‍යාග කරන ලදී.













# 4 ශ්‍රීලපාහ පුවත්

## බලඇණි පුහුණුවීම්



**"සෙබළාට ලබාදිය හැකි හොඳම සුබසාධනය පුහුණුවයි"** යන පාඨය පෙරදැරිව 4 ශ්‍රීලපාහ ඒකකය බලඇණි සාමූහික පුහුණුව මුලතිව් අලම්පිල් බලඇණි පුහුණු පාසැලේදී 2014.05.19 දින ආරම්භ කරන ලදී. 59 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑස් ද ඉසෙඩ් වික්‍රමරත්න යූඑස්පී පීඑස්සී අයිජී විසින් ආරම්භක දේශනය සිදු කළේය. නිලධාරීන් 12 ක් හා සෙසුනිලයින් 366 ක් මෙම පුහුණුවීම් වෙනුවෙන් සහභාගි වන ලදී. මෙම පුහුණුවේදී ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය, සිතියම් කියවීම, යුද උපක්‍රම, කොම්පාසුව ආධාරයෙන් ගමන් ගැනීම, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, ප්‍රතිවිප්ලවකාරී සටන්, නාගරබද සටන්, ආධාරක අවි පිළිබඳ පුහුණුවීම් සහ ඉංජිනේරු දේශණය, සංඥා දේශණය, පුද්ගලික සෞඛ්‍ය හා ප්‍රථමාධාර දේශණය, මානව හිමිකම් දේශණයන් තුළින් දැනුම වර්ධනය කර ගැනීමට හැකියාව ලැබිණි. මාසයක් පමන කාලවකවානුව තුළදී සොල්දාදුවාගේ දරාගැනීමේ ශක්තිය වර්ධනය කරගැනීමට ද කටයුතු කරන ලදී. ඒ අනුව වෙහෙසකර පා ගමන් කිහිපයක්ද මෙම කාල සටහනට ඇතුලත් වී තිබුනි.

ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ජීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහගේ නිවැරදි මග පෙන්වීම යටතේ ඒකක දෙවන අණදෙන නිලධාරී මේජර් ආර්ඒද සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ප්‍රධාන උපදේශක වශයෙන් ලබාදුන් උපදෙස් මත හා ඒකකයේ ක්‍රියා හා පුහුණුභාර නිලධාරී මේජර් ඊඑල්සී එදිරිසිංහ ආර්එස්පීගේ උනන්දුව හා කැපවීම මත මෙම පුහුණු පාඨමාලාව සාර්ථකව නිමා කිරීමට හැකි විය. මෙම පුහුණුවීම් අතරතුරදී අධ්‍යක්ෂ පාබල මේජර් ජෙනරාල් එල්ඩබ්ලිව්සීබීබී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී 2014.06.14 දින පුහුණුවීම් සිදු කරන ආකාරය පිළිබඳව සොයා බලා කළමණාකරණය පිළිබඳව හරවත් දේශණයක් කරන ලදී.

ආසේමු (මු) බළප්‍රදේශයේ සිදු කළ බලඇණි පුහුණුවීම් වලදී ඒකක වලට නොලැබුනු අවස්ථාවක් ඒකක අණදෙන නිලධාරීගේ මැදිහත් වීමෙන් පූනෑව නාවික හමුදා මූලස්ථාන වෙඩිපිටියේ ජීව වෙඩි තැබීම් සිදු කිරීමට හැකිවිය. ලැබුණු අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගනිමින් විවිධ වෙඩි තැබීම් ක්‍රමවලට අමතරව අත් බෝම්බ විසි කිරීමේ අවස්ථාවද ලබාගන්නා ලදී. ජීවි වෙඩිතැබීම් සිදු කිරීමේදී පාඨමාලාවේ හොඳම වෙඩික්කරු තේරීමද සිදු කළේය.

2014.06.24 දින බලඇණි පුහුණුවීමේ අවසන් අධියර ලෙසින් මාසයක් පුරා ලබාගත් පුහුණුවේ දක්ෂතා ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව උදාවිය. සතුරු කඳවුරක් වෙත පහර දී එය අත්පත් කරගැනීමේ අභ්‍යාසය මැනවින් කරන ලදී. මෙහිදී 59 සේනාංකාධිපති ප්‍රමුඛ සියලුම දෙනා විශ්මයට පත් කරමින් අති දක්ෂ ලෙස එම අභ්‍යාසය ඒකක භටපිරිස් විසින් සිදු කළහ. පුහුණු අභ්‍යාසය සිදු කළ ආකාරය පිළිබඳව පැහැදිලි වූ සේනාංකාධිපති ඒකකයේ කැපවීම් හා පුහුණුවීම් පැසසුමට ලක් කරන ලදී. පුහුණුවීම් අවසානයේදී කණ්ඩායම් අතුරින් දක්ෂතා දක්වූවන්ට කුසලාන පිරි නැමීම සිදු කරන ලදී. මෙහිදී හොඳම කණ්ඩායම ලෙස 'බී' කණ්ඩායම ද, දක්ෂතම බණ්ඩහාර නිලධාරී ලෙස 'බී' කණ්ඩායමේ නි/67664 ලුතිතන්



එච්ආර්එස්ජේ විජේසිංහ ශ්‍රීලපාහ ද, හොඳම බණ්ඩහාර සැරයන් ලෙස 'ඒ' කණ්ඩායමේ සෙ/313387 සැරයන් සුමතිපාල කේඑම් ද, දක්ෂතම පෙළ අණදෙන්නා ලෙස 'ඒ' කණ්ඩායමේ සෙ/316785 කෝප්‍රල් හේවාතිලක එච්පීඑස් ද, දක්ෂතම වෙඩික්කරු හා අතිශූර සෙබළා ලෙස 'බී' කණ්ඩායමේ සෙ/317926 කොප්‍රල් ජයසූරිය ජේකේඑස්පී ද, කුසලාන ලබා ගන්නා ලදී. 59 සේණාංකාධිපති ගේ අවසන් දේශණයෙන් පසු බලඇණි පුහුණුවීම් නිමාවන ලදී. එදින රාත්‍රියේ ඒකක චතුරංග අධි රිද්ම සංගීත කණ්ඩායමේ මියුරු සංගීත රාවය විඳ පසුදින පුහුණු පාඨමාලාව සඳහා සාමූහික නිවාඩු ලබාදීම සිදු කරන ලදී.

**බුද්ධි අංශය - 4 ශ්‍රීලපාහ**




## නිවැරදි කිරීමයි

80 වන වයිට් හැකල් කලාපයේ විසි අටවන පිටුවේ **24 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරී නිවස්නය** යන මාතෘකාව **20 ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරී නිවස්නය** යනුවෙන් නිවැරදි විය යුතු බැව් දන්වා සිටිමි.

පිටු සැකසීමේදී සිදු වූ අතපසුවීමකින් 20 ශ්‍රීලපාහ අණදෙන නිලධාරීතුමන් පත් වූ අපහසුතාවය පිළිබඳව අපි කනගාටු වන්නෙමු.

**වයිට් හැකල් කාර්ය මණ්ඩලය**

# 6 ශ්‍රීලපාහ පුවත්

## රණවිරු පිංකම





දශක තුනක් පුරා ශ්‍රී ලංකාව තුළ පැවති බෙදුම්වාදී ත්‍රස්තවාදය ත්‍රිවිධ හමුදාවේ අප්‍රතිහත ධෛර්ය හා කැපවීම මතින් මුලිනුපුටා දැමීමෙන් පසු සමස්ත ශ්‍රී ලංකාවාසීන්ටම නිදහස් නිවහල් රටක සතුටින් ජීවත්වීමට වරම් හිමි විය. මේ වෙනුවෙන් ප්‍රානදානයෙන් කැපවුනු වීරෝදාර රණවිරුවන්ගේ ආදරණීය දෙමාපියන්, බිරින්දෑවරුන් හා දූදරුවන් විසින් සිදු කරන ලද අප්‍රමාණ කැපවීම සිවිල් සමාජය තුල මේ වනවිට බොහෝ දෙනෙකුගේ සිත් තුළින් ඈත් වෙමින් පවතී.

මෙවැනි කාල වකවානුවක පුරා වසර 24 ක කාලය තුළ යුද පෙරමුණේම සිටි 6 ශ්‍රීලපාහ ඒකකයේ හිටපු අණදෙන නිලධාරිවරයෙකු වූ වර්තමානයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ උදාරතර සංකල්පයක් අනුව වසර 15 ක් පුරා අඛණ්ඩව සිදු කළ මියගිය රණවිරුවන්ගේ ඥාතින්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී. මෙවරද වාර්ෂික රණවිරු පිංකම අගොස්තු 30 සහ 31 දෙදින තුළ ජීවිත පරිත්‍යාග කළ රණවිරුවන් 464 හාරසිය හැට හතර දෙනාගේ ළඟම ඥාතීන්ගේ සහභාගිත්වයෙන් ගොඩනැගුනු 6 ශ්‍රීලපාහ රණවිරු සංගමය හා එක්ව සංවිධානය කළ උත්සවය යුද්ධ හමුදාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් මිහින්තලය මහකනදරාව 6 ශ්‍රීලපාහ මුලස්ථානයේදී අතිසාර්ථක අයුරින් පැවැත් වූහ.

අගෝස්තු මස 30 දින ශ්‍රී ලංකාවේ ඒකීයභාවය වෙනුවෙන් ප්‍රානදානයෙන් කැපවූ රණවිරුවන්ටත්, ඔවුන්ගේ පවුල් වල ඥාතීන්ටත්, යුද්ධ හමුදාධිපති තුමාටත්, යුද්ධ හමුදාවට සහ සමස්ත රටවැසියන්ටත්, සෙත්පතා පසුදින පහන් වන තුරු පිරිත් සජ්ඣායනාව පවත්වන ලදී. පසු දින උදෑසන මහා සංඝරත්නය එකසිය තිස් දෙනමක් විෂයෙහි හීල් දානය පිළිගැන්වීමද, යුද්ධ හමුදාධිපති තුමාගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී. එහිදී මිරිසවැටි මහා විහාරාධිපති නායක ස්වාමින් වහන්සේ විසින් අනුශාසනාවක් පවත්වා රටදැය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ට පිංපෙත් පමුණුවන ලදී. මෙම මහා පුණ්‍ය කර්මය සඳහා රණවිරු ඥාතින් 600 ක් පමණද ගම්වාසින් 1200ක් පමණද සහභාගි වූහ. එමෙන්ම ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සියයකට අධික ප්‍රමාණයක් සහභාගි විය.

මෙම පිංකම සංවිධානය කිරීමේදී ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේජ් පුෂ්පකුමාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ඇතුලු සියලුම නිලයින් දිවා රෑ නොතකා විශාල කැපවීමක් සිදු කළ අතර, එහි ප්‍රතිඵලය රණවිරු මාපියන් ඉතා ප්‍රශංසනාත්මකව අගයන ලදී. පිංකමේ විශේෂත්වයක් වූයේ මෙම කාලසීමාව තුළ සම්පූර්ණ කඳවුරට නිර්මාංශ ආහාර පාන ලබාදෙමින් ආගමානුකූලව කටයුතු කිරීමත් ඒකකයේ සේවයේ යෙදී සිටි හා දැනට ඒකකයේ පිටත රාජකාරි කරන සියලුම අයවලුන්ට ආරාධනා කර තිබීමයි උත්සවය අවසානයේ එළඹෙන පිංකමද, මෙයටත් වඩා ඉතා සාර්ථකව කරගැනිමට අවශ්‍ය උපදෙස් යුද්ධ හමුදාධිපති තුමා විසින් ලබා දෙමින් මෙම උතුම් කටයුත්ත නිමා කරන ලදී.

**බුද්ධි අංශය 6 ශ්‍රීලපාහ**







# 7 ශ්‍රීලපාහ පුවත්

## ප්‍රජා සත්කාර

අප රණවිරුවන් සතුරු බලකොටු බිඳ හෙලමින් අභීතව යුද වැදුනේ කිසිදු ජාතියකින් පලිගැනීමේ හා ද්වේශ සහගත චේතනාවකින් නොව හුදෙක්ම ද්‍රවිඩ ජනයාගේ නිදහස් අයිතීන් පැහැරගනු ලැබූ කුරිරු ත්‍රස්තවාදය මුලිනුපුටා දමමින් සියලු ජනවාර්ගිකයින්ට නිදහසේ ජීවත් විය හැකි සාමකාමී ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමේ පරම පවිත්‍ර චේතනාවෙන් වූ බැවිනි. මෙහිදි අප රණවිරුවන් නොයෙකුත් අයුරින් අවතැන් වූ මහජනයාට සත්කාර කටයුතු වල නියලුනේ මනුෂ්‍යත්වයේ උතුම් වූ ගුණ ධර්ම වලට මුල්තැන දෙමින්ය. දශක 03 කට අධික කාල සීමාවක් රටෙහි පැවති සාපලත් යුද්ධය නිමවීමත් සමඟ අද ඔවුන්ගේ ජීවන රටාව නව මගකට යොමු වෙමින් පවතින අතර, තමන්ගේ දූ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරනු පිණිස යන්තමින් හෝ අධ්‍යාපනයක් ලබා දෙන්නට මහත් වෙරවීරියක් දරනු ලබයි. නිදහසේ අරුණලු උදාවීමත් සමඟ නැවත පදිංචි කිරීමේ පදනම මත තම ගම්බිම් බලා පිටත් වූයේ දහසක් සිතුවිලි තම සිත් වල රඳවාගෙන ඇති බැවි අප ඒකකය ස්ථානගත බලප්‍රදේශයන්හි නැවත පදිංචි කරවා ඇති ජනයාගේ මුහුණුවර සටහන්ව ඇති බවට අපට පෙනී යයි.



උතුම් වූ ගුණ ධර්මයන්ට මුල්තැන දෙමින් කිලිනොච්චි ප්‍රදේශයේ සිවිල් සමාජයට දූකේදී හා සැපේදී නිරන්තරයෙන් කැපවෙන 7 ශ්‍රීලපාහ ඒකකය තවත් ප්‍රජා සත්කාරයක් අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ මඟ පෙන්වීම යටතේ නොබෝදා සිදු කරන ලදී.

කිලිනොච්චි ප්‍රදේශයේ ස්ථානගත ඒකක බලප්‍රදේශයට අයත් ජයන්තිනගර් ග්‍රාමසේවා වසමේ පදිංචි කන්දයියා සසිකුමාර් මහතා ඇතුලු අට දෙනෙකුගේ සමන්විත



නිවැසියන් සඳහා නිවාසයක් සාදා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. මෙහි විශේෂත්වය වනුයේ එම පවුලේ සාමාජිකයින්ගෙන් හය දෙනෙකු අනාගතය භාර ගැනීමට සිටින හයක්, හතරක් නොදන්නා දූ දරුවන් වීමත්, අකුරක් ඉගෙන ගන්නවත් හරි හමන් ස්ථානයක් නොමැති සේම පතක්, පොතක්, පෑන, පැන්සලක් ගැනීමට තරම්වත් වත්කමක් ඔවුන්හට නොමැති ඉතා දිළිඳු පවුලක් වීමය.

මෙම ඒකක බල ප්‍රදේශයන්හි පදිංචිව සිටින ජන කොටස්හි ගැටලුකාරි තත්ත්වයන් මනාව හඳුනාගත් ඒකක අණදෙන නිලධාරි ගේ අධීක්ෂණය යටතේ ඒකකයේ නිලධාරීන් හා සෙබුනිලයින්ගේ මූල්‍ය හා ශ්‍රම දායකත්වයෙන් හා අණදෙන නිලධාරී ගේ සහෝදරියන්/පවුලේ ඥාතින්ගේ මූල්‍යමය දායකත්වයෙන් මසක් වැනි ඉතා කෙටි කාල සීමාවක් තුලදී (ලක්ෂ පහක) පමන වටිනාකමකින් යුත් නව නිවසක් සාදා නිම කරන ලදී.

2014.06.04 වන දින 57 සේනාංකාධිපතිගේ සුරතින් නිවසට ඇවැසි අත්‍යවශ්‍ය බඩු භාහිරාදිය සමගින් හා අධ්‍යාපනය ලබන දූවා දරුවන්ට ඇවැසි පාසල් උපකරණද, සමඟ නව නිවස නිවැසියන් හට පිරිනමන ලදී. යහපත් චේතනාවෙන් යුක්තව මෙවැනි මනුෂ්‍යවාදී ගුණධර්ම ගොඩ නැංවීමෙහිලා පෙරමුණ ගෙන ක්‍රියා කළ අණදෙන නිලධාරී ඇතුලු ඒකකයේ සියලුම අයවලුන්හට එහි ආශිර්වාදයෙන් ප්‍රදේශයේ ජන ජීවිත හා අප සැම එක මවකගේ දරුවන් ලෙසින් සමගිදාමයෙන් බැදේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.



බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ


# 11 ශ්‍රීලපාහ පුවත්

## බළඇණි දින සංවත්සරය



හත්වන බළඇණි දින සංවත්සරය 2014 ජුනි මස 25 වන දින සමරන්නට 11 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි. ඒකක සංවත්සර දිනයට සමගාමීව වැඩසටහන් රාශියක් සිදු කරන ලදී. ඒකකය සමඟින් රාජකාරි කරමින් සිටියදී දේශයේ භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් ප්‍රාණදානයෙන් කැප කළ රණවිරුවන් 222 වෙනුවෙන් හා තුවාල ලබා රෝහල් ගතව සිටින රණවිරුවන් 989 දෙනා වෙනුවෙන් ආගමික වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් ඒකකය වෙත ගෙන්වා 2014 ජුනි මස 22 වන දින යාපන අර්ධද්වීපයේ පූජනීය ස්ථාන වන්දනාමාන කිරීමට හා පුණ්‍යානුමෝදනා කටයුතු සිදු කිරීමට අවස්ථාව උදාකර දෙන ලදී. මියගිය රණවිරුවන්ට පිංපතා හා ආබාධිත තත්ත්වයේ පසුවන රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනය කරමින් ඓතිහාසික දඹකොළ පටුන විහාරස්ථානයේදී බෝධි පූජා පිංකමක් සිදු කර පසු දින සංඝයා වහසේලා දසනමක් වඩම්මවා සාංඝික දානයක් ලබාදෙන ලදී. ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් වීඩීඑස් පෙරේරා ශ්‍රීලපාහ විසින් පැමිණ සිටි මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් ඇමතිමේදී කියා සිටියේ රට ජාතිය රැක ගැනීම උදෙසා තම ආදරණීය පුතුනුවන්, ආදරණීය ස්වාමියා, ආදරණීය පියාණන් තම ජීවිතය කැප කිරීම අමරණීයයි, එමෙන්ම සැමදා අප ඔබ සමඟින් අත්වැල් බැඳ මියගිය අභීත රණවිරුවා වෙනුවෙන් කළ යුතු මෙවැනි පුණ්‍ය ක්‍රියා සැම දිනකම කිරීමට අප සියලුම දෙනා ඇප කැපවී සිටින බැව් පවසා ඔවුන් වෙත පැණනැගී ඇති ගැටලු පිළිබඳවද සොයා බලා විසඳුම් ලබාදෙන ලදී.

ඒකක ධජයට සෙත් පැතීම සඳහා ඒකක අණදෙන නිලධාරි ඇතුළු සියලුම නිලධාරීන් හා සෙසුනිලයින් කතෝලික ආගමික දේවස්ථානයක් වන ශාන්ත මරියා දේවස්ථානය වෙත හා හින්දු ආගමික දේවස්ථානයක් වන සිවන් කෝවිල වෙත ගොස් ආගමික වතාවත් හි නියෙලෙමින් පාබල මැණියන්ට සෙත්පතන ලදී. 2014.06.25 වන දින බළඇණිය අණදෙන නිලධාරි හට සම්මාන මුරයක් ලබාදීමට කටයුතු කළේය. මෙම සුවිශේෂි දිනය සිහි කිරීමට අඹ පැලයක්ද රෝපණය කිරීමට අණදෙන නිලධාරි අමතක කළේ නැත. ඒකකය වසර හතක් තිස්සේ ගමන් ගත් මග පිළිබඳ සඳහන් කරමින් හටපිරිස් ඇමතීමක්ද සිදු කරන ලදී. එහිදී එතුමන් විසින් ඒකකය මෙහෙයවූ හිටපු අණදෙන නිලධාරිවරුන් සිහිපත් කළ අතර, දිනෙන් දින යුද හමුදාව තුළ රාජකාරි සිදු කිරීමේදී යුද හමුදාවේ කීර්තිනාමයක් කැළලක් නොවන අයුරින් රාජකාරි සිදු කරන ලෙස ඔවදන් රැසක් ලබාදෙන ලදී. පසුව ඒකක සියලුම නිලයින් වෙනුවෙන් සකස් කරන ලද දිවා භෝජන සංග්‍රහයද භුක්ති විඳින ලදී.



ඒකක සංවත්සරයට සමගාමීව ඒකක බළලත් නිලධාරි නිවස්නයේදී තවත් එක් සුවිශේෂි උත්සවයක් සිදු කරන ලදී. විශ්‍රාම ගිය බළලත් නිලධාරීන් හා ජෝකොනොනින් වෙනුවෙන් තිළිණ ප්‍රදානය කිරීමට කටයුතු කරන ලදී. එහි ප්‍රධාන ආරාධිතයා ලෙසින් ඒකක අණදෙන නිලධාරිසහභාගි වන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මෙන්ම ශ්‍රී ලංකා පාබල හමුදා මැණියන්ගේ නාමය බබලවන ඒකකය බවට පත්වීමට ඇවසි ශක්තිය ධෛර්යය ලැබේවායි අප සැම ඉත සිතින් 11 ශ්‍රීලපාහ ඒකකයට ප්‍රාර්ථනය කරන්නෙමු.

**බුද්ධි අංශය - 11 ශ්‍රීලපාහ**







# VIVID MEMORIES

## Lieutenant General HV Atukorale (Retired) VSV psc FBIM

**Lieutenant General HV Athukorale (Retired) VSV psc FBIM, leaves a plethora of records to savour but he will be best remembered for his remarkable achievements during the period as the Commanding Officer of the 1st Battalion Ceylon Light Infantry ( 1 CLI).**

**Lieutenant Colonel HV Athukorale psc revised and translated the Battalion Standing Orders into Sinhala. He recorded and published the History of the Battalion for the first 25 years. The Regimental Anthem was composed and released for the first time in the History of the Army and the Regiment in 1973 with his guidance. He is also responsible for the establishment of the Buddhist Shrine Room and the Regimental Museum on 30 June 1974 at the premises of the Regiment.**

**He published the first Special Part I Order on 7 January 1974 recording the death of Major SDD Samarasinghe CLI. Since then publishing of a Special Part I Order to record a death of Serving/Retired Officers/ Other Ranks is being followed by all the Battalions in the Army, Sri Lanka Navy, Sri Lanka Air Force , Sri Lanka Police and are distributed at the funeral of such deceased Officers and Other Ranks.**



**Lieutenant General Henry Vijaya Athukorale (Retired) VSV psc FBIM now almost 84 years of age, is the son of Mr RP Athukorale and Mrs LN Perera. Born and raised in Colombo, H V Athukorale's talent was evident even at his school St. Josephs College Colombo where he obtained College and Public Schools Colours for Athletics.**

**Very recently I had the privilege to visit Lieutenant General H V Athukorale (Retired) VSV psc FBIM at his residence at No: 178, Hill Street, Dehiwala, seeking an opportunity to interview him to publish an article in the White Hackle magazine. So you will no doubt understand how delighted and grateful I felt when he confirmed he was willing to disclose his memories to the magazine.**

**Here is what Lieutenant General HV Athukorale (Retired) VSV psc FBIM had to say:**

### Your childhood memories?

I was born in Colombo near to Ananda College. My father who was working at the Railway Department was originally from Watareka in the Homagama area. Those days' people did not have cars and my farther too had to travel daily to his work place at the Maradana Railway Station by foot. Most of the people working in Colombo during said period has the habit of purchasing properties and build houses near to their work places or near to a school. So my father also constructed a house at Zaleski Place close to the Kuppiyawatte Temple, near to Ananda College. I was the third child out of eight children. I have three brothers and four sisters. My childhood was extremely happy. You will see this as a big family but there were 8 to 10 children in a family during our era. The modern type parents have reduced the number of children in a family.

### Your school life?

My father, grandfather and great grandfather were old boys of St. Josephs Collage. I studied at St. Josephs College Colombo. I was awarded St. Josephs College Colours in Athletics and Public School Colours in athletics too. When I passed the Senior School Certificate Examination I went to Ananda Collage Colombo for my higher education. But I could not complete the University Entrance Examination as I joined the Ceylon Army.

**APPOINTMENTS HELD**

- Officer Cadet Royal Military Academy, Sandhurst, UK
- Platoon Commander, 1 CLI, Ceylon Light Infantry
- Second-in-Command, Army Recruit Training Depot
- Chief Instructor, Drill and Weapon Training Wing, ATC
- Instructor, Tactics Wing ATC
- Company Second-in-Command - 1 CLI
- Company Commander - 1 CLI
- Deputy Assistant Quarter Master General, AHQ
- Deputy Assistant Adjutant General, AHQ
- Welfare Officer, Sri Lanka Army
- Assistant Official Languages Supervising Officer
- Battalion Second-in-Command
- Battalion Commander – 1 CLI
- Commander, Task Force Illicit immigration
- Commander, South Eastern Command
- Commandant Army Training Centre, Diyatalawa
- Director Personnel Administration, AHQ
- Inspector General, Field Forces
- Director, Army Headquarters
- Commandant Sri Lanka Army Volunteer Force

### When did you join the Army?

Whilst I was at Ananda College I applied for the post of Officer Cadet in the Ceylon Army to go to Sandhurst. The Ceylon Army was formed in 1949 and I was enlisted on 30 Sep 1950. Those who were joined the Army within the first year of the Army were awarded the Ceylon Armed Services Inauguration Medal. Besides General Cyril Ranathunga I am the only other officer in Sri Lanka with that medal.

### How was your Military training?

I completed my Basic Army Training Course by the British Army Training Team at the Army Training Centre at Diyathalawa in 1950. Then Mons Officer Cadet School, Aldershot in 1951 and Royal Military Academy Sandhurst, UK in 1951 to 1952. I was Commissioned in the 1st Battalion Ceylon Light Infantry as a Second Lieutenant after having passed out from the Royal Military Academy, Sandhurst on 31 July 1952.

### Who were the other Ceylon Army Cadets who were with you at Sandhurst?

There were Six Cadets in my Intake. They were Officer Cadets David Raymond (retired as Major), N Amirthalingam (retired as a Capt), S B Miyanadeniya(retired as a Brigadier), PKB Pereira (retired as a Brigadier), N Madawala (retired as a Major General). The Officer Cadets Dennis Hapugala, Cyril Ranathunga (retired as General), Arthur Bartholamieus and Dennis Perera (former Commander of the Army) were one batch senior to me at Sandhurst. All of them are no more except Gen. Cyril Ranathunga (retd).

### Do you have any special and significant memories during training?

Yes, I won the Gold Medal in the Hop Step and Jump Event representing the Royal Military Academy, Sandhurst, UK at the Military Academics Athletic Pentangular held in Breda, Holland in 1952. Also I received the Royal Military Academy Sandhurst Athletic Colours in 1952.

**HONOURS AND AWARDS**

- The Ceylon Armed Services Inauguration Medal
- The Ceylon Armed Services Long Service and Good Conduct Medal
- Republic of Sri Lanka Armed Service Medal
- The Ceylon Army Silver Jubilee Medal
- President's Inauguration Medal
- Sri Lanka Armed Services Long Service Medal
- Vishista Seva Vibushanaya
- Poorua Bhumi Padakkama

## Your Married life?

It was an arranged marriage. I agreed with the proposal at once when I saw her because I did not have any reason to say no. She was a very beautiful lady. Her name was Mallika Dharmathilaka. Our wedding ceremony was held at the Galle Face Hotel on 06 July 1966. Major General AM Muttukumaru and Major General HWG Wijeyekoon signed as the attesting witnesses for the marriage. My wife who always supported me never gave me any burdens at home. We were blessed with four children namely Late Mayanthi, Ranjika, Dushyanthi and Vipula the only son.



## During your tenure as the CO 1 CLI, you introduced a new lanyard to the battalion?

Yes, initially Army personnel were wearing an ordinary Khaki coloured lanyard. Actually this red coloured lanyard was designed by Lt Col PW Jayantha de Silva who is now in Australia. The red coloured Lanyard is unique, striking and completely a new thing. When you wear the red one it gives some colourful and glamour to the uniform. I agreed for his proposal and that's it.

## What was the reason to build a temple inside the camp premises?

Our country is a Buddhist country. Soldiers had to go out to the temple on Poya days. Therefore I constructed our temple at the CLI premises. The Buddha statue was designed by well-known Buddhist artist Mapalagama Wipulasara Thero.

## You may have any memories with Regimental Mascot, "Kandula"?

The first Mascot was a Deer. Whilst being trained by the Bandmaster the Deer jumped up and fell dead. As CO 1 CLI Maj Gen Richard Udugama negotiated with the then Director of the National Zoological gardens Dehiwala, Maj Weiman and obtained a Baby Elephant on loan. A Civilian who was familiar with Elephants was enlisted as the Mascot keeper. The Elephant was named as Kandula. The late Capt Bertie Dias once tried to play the fool with Kandula. Kandula got angry and caught Capt Bertie Dias and placed him against the wall but did no harm to him. Alls well that ends well.

## Your life as a Senior Military Officer in the Army?

Incidentally I am the most Senior Officer living in Sri Lanka except General Cyril Ranatunge. It gives me immense pleasure to think of my Military Carrier in the Army. Its sweet memories are still fresh in my mind. I am indeed happy that some of the Battalion Orders I have introduced during my period as CO 1 CLI are now being followed by the Army, Navy and Air Force.



## Your advice to the present Military Officers?

Firstly perform your duties to the best of your ability in the appointment assigned to you without fear of favour. Do not get involved in any form of political activity whilst in service. The Secretary to HE the President Mr. Lalith Weerathunga and the Secretary Defence Col Gotabhaya Rajapakshe recommended that I should be promoted to the Rank of Lt Gen. The Cabinet approval was necessary and after such was received His Excellency the President promoted me to the rank of Lt Gen WEF 12 Feb 2014.

### SPECIAL APPOINTMENTS HELD

- ★ Co-ordinating Officer - Polonnaruwa District During Insurgency - 1971
- ★ Co-ordinating Officer- Kegalle District during Insurgency - 1971
- ★ Co-ordinating Authority-Badulla District during Communal Riots - 1977
- ★ Commander Security Forces Jaffna District – 1980-1981
- ★ Member Reserve Affairs Council , Minister of Defence – 1995 To Date.
- ★ Trustee of the Sri Lanka Ex-Servicemen's Institute.
- ★ Chairman, Sri Lanka Light Infantry Association (1987 -1977)

### COURSES OF TRAINING

**Local**

- ★ Physical training Instructor's Course
- ★ Jungle Warfare Course
- ★ Drill and Weapon Training Course
- ★ Pre-Staff College Course
- ★ Air-Photo Interpretation Course

**Foreign**

- ★ Infantry Platoon Weapons Course, School of Infantry, Hythe, UK
- ★ Infantry Platoon Commanders War Minster, UK
- ★ Command and Staff Course, Defence Services Staff Collage, Wellington, India



### RECORDS OF GAMES AND SPORTS ACTIVITIES

- ★ St, Josephs College Colours in Athletics.
- ★ Public Schools Colours in Athletics.
- ★ Gold Medalist in the Hop Step and Jump event representing the Royal Military Academy, Sandhurst, UK at the Military Academics Athletic Pentangular held in Breda,Holand in 1952.
- ★ Royal Military Academy Sandhurst Colours in Athletics.
- ★ Member Army Rugger XV -1952
- ★ Member Army Hockey XI -1952-1958
- ★ Chairman, Army Basket Ball Committee.
- ★ Chairman, Army Hockey Committee
- ★ Chairman, Army Athletics Committee.
- ★ Member of Unit Shooting team which won the Governor General's cup - 1955
- ★ Army Colours for Rifle Shooting.
- ★ Vice President, Ceylon Amateur Athletic Association 1973-1976
- ★ President, National Rifle Association of Sri Lanka. 1983 - 1986
- ★ President, Amateur Athletic Federation of Sri Lanka 1983-1986

**Colonel Samantha Wickramasena RWP RSP psc - Chief of the Staff RHQ SLLI**

ලුතිතන් ජෙනරාල් එච්ච් අතුකෝරාළ (විශ්‍රාමික) විඑස්වි පිඑස්සි එෆ්ඩිඅයිඑම් නිල උසස්වීම් ලැබීම හා මේප
පිළිබඳ අමාත්‍යාංශයේ ගරු ලේකම් ධුරයට පත්වීමෙන් ශ්‍රී ලංකා පාබල හමුදාවට ලද කීර්තිය හා මෙම ජ්‍යෙ
පැයට රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවති සම්මාන පෙළපාළියේදී සහ එදින රාත්‍රී 1930 පැ










ර් ජෙනරාල් එන් මල්ලවආරච්චි (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී නීතිය හා සාමය
ෂ්ඨ නිලධාරීන්ගෙන් සිදු වූ අනුපමේය සේවය අගය කිරීම සඳහා 2014 සැප්තැම්බර් මස 30 වන දින 0900
යට පැවති රාත්‍රී භෝජන සංග්‍රහයේදී කැමරා කාචයේ සනිටුහන් වූ විශේෂිත දසුන් කිහිපයක්...















# ජාතික හා ජාත්‍යන්තරය ජයගත් පාබල තරුව



ජාත්‍යන්තර ලෝකඩ ඡායා වෙඩි තැබීම තරඟාවලිය 11 වන වරට මෙවර පැවත්වූ අතර, චෙක් ජනරජයේදී 2014 ජූලි මස 13 දින සිට 27 දින දක්වා පැවැත්විය. මෙම තරඟාවලිය නියෝජනය කරමින් ශ්‍රී ලංකා සංචිතයට ක්‍රිඩක/ක්‍රීඩිකාවන් 15 දෙනෙකු සහභාගි විය. මෙම කණ්ඩායමට ශ්‍රී ලංකා යුද හමුදා ක්‍රීඩකයින් හය දෙනෙකු ඇතුලත් විය. යුද හමුදා ක්‍රීඩකයින් හය දෙනාගෙන් එක් ක්‍රීඩකයෙක් වන්නේ 4 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ සෙ/309332 වර්ණ සැරයන් ලසන්ත ජීකේඑච්එම් (ආර්එස්පී) යන ජ්‍යෙකොනොනිය.

සමස්ත තරඟාවලියේදී රටවල් තිහක් නියෝජනය කරන ලද අතර, ශ්‍රී ලංකාව වෙත පදක්කම් 17 ලබා ගනිමින් තෙවන ස්ථානය හිමිකර ගැනීමට සමත් වී ඇත. මෙම පදක්කම් 17 අතුරින් ශ්‍රී ලංකා යුද හමුදා ක්‍රීඩකයින් විසින් පදක්කම් 11 කට හිමිකම් කියන ලදී. ශ්‍රී ලංකා යුද හමුදා ක්‍රිඩකයින් විසින් ලබාගත් පදක්කම් 11 අතුරින් පදක්කම් 4ක් (රන් 01 හා ලෝකඩ 03) සඳහා ශ්‍රී ලංකා පාබල හමුදාව නියෝජනය කළ ක්‍රීඩකයා විසින් හිමි කර ගන්නා ලදී.



ශ්‍රීලපාහ රෙජිමේන්තුව රනින් සරසන්නට හැකි වූ වර්ණ සැරයන් ලසන්ත විසින් ජාත්‍යන්තර තරඟයන්ට ඉදිරිපත් වී දක්වූ දක්‍ෂතාවන් මෙසේ සනිටුහන් කරන්නෙමු.

| | |
|---|---|
| ස්මෝල් බෝ ලයිට් රයිෆල් බී කණ්ඩායමේ තුන්වන ස්ථානය | - ලෝකඩ පදක්කම් 01 |
| සමස්ත තරඟාවලියේ කණ්ඩායම් තුන්වන ස්ථානය | - ලෝකඩ පදක්කම් 01 |
| බිග්බෝ සැහැල්ලු රයිෆල් අංශය - තුන්වන ස්ථානය | - ලෝකඩ පදක්කම් 01 |
| බිග්බෝ සිලුවට් රයිෆල් අංශය - බී ඛණ්ඩයේ ප්‍රථම ස්ථානය | - රන් පදක්කම් 01 |

වර්ණ සැරයන් ලසන්ත මෙම ජාත්‍යන්තර තරඟයට සහභාගි වීමට ප්‍රථම ජාතික, යුද හමුදා සහ ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම් නියෝජනය කරමින් විශිෂ්ට ලෙසින් ජයග්‍රහන රැසක් හිමිකර ගන්නා ලද ක්‍රීඩකයෙකි.

රෙජිමේන්තු, යුද හමුදා, ජාතික හා ජාත්‍යන්තරයේ පෙළහර පා ඒකකයට, රෙජිමේන්තුවට, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හා ශ්‍රී ලංකාවට විශාල කීර්තියක් ගෙන දී ඇති මෙම ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරි ශ්‍රී ලංකා පාබල හමුදාවෙන් බිහි වූ විශිෂ්ටතම ක්‍රීඩා තරුවක් බැව් ආඩම්බරයෙන් යුතුව සනිටුහන් කරන්නෙමු.



### රෙජිමේන්තුව නියෝජනය කරමින්

අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික වෙඩි තැබීම් තරඟාවලිය
- 2006, 2007,2008, 2010, 2011, 2012 හා 2013

ප්‍රායෝගික රයිෆල් තරඟාවලිය
- 2006, 2007,2008, 2011, 2012

අන්තර් රෙජිමේන්තු පිස්තෝල තරඟාවලිය - 2006, 2007,2008,

### යුද හමුදා කණ්ඩායම නියෝජනය කරමින්

ජාතික ප්‍රායෝගික පිස්තෝල තරඟාවලිය
- 2007,2010, 2011, 2012, 2013 හා 2014

ජාතික ලෝකඩ ඡායා වෙඩි තැබීම තරඟාවලිය
- 2011, 2012, 2013, 2014

### ජාතික කණ්ඩායම නියෝජනය කරමින්

ජාත්‍යන්තර ලෝකඩ ඡායා වෙඩි තැබීම තරඟාවලිය
- 2014

**වයිට් හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ**

# පැන්ෂන් ගිය මහත්වරුනි පනාගොඩට ඇවිත් යන්න



යුද සෙබළා සරඹ කරන  සරඹ භූමියක් ද                පෙනේ
ඈත සිටන් බලන අයට මුළුනැන් ගෙය සැදෙනු           පෙනේ
වියොතුන් සිතුවිලි දහරින් පාබල මව් රැකෙනු          පෙනේ
ඉදිවන නව පාර වලට සළකුණු මඟ වැටෙනු              පෙනේ

පාබල මවට තව තව දේ සිදු                                    වේවී
කළ සේවයට මල් සුවඳක් එක්                                 වේවී
පාබල සෙබළු හට ඔබ යලි යලි සිහි                          වේවී
සිරිලක් මවට ඔබ රන් දරුවෙක්                              වේවී



පාබල මැදුර පෙර නටබුන් වූ                                  ඒවා
පෙර ගොඩනැගිලි  සරඹ භූමිය ද                              මේවා
පුබුදා නැගෙන මේ අරුනැලි හද                               ගාවා
කවි සිතුවිලි නැගී කවි හද විකසිත                           වූවා

එංගලන්ත රැජිනට රැකවල්                                   දුන්නු
ලක්මව සනසවන පාබල හැඩ                                 පෙන්නු
වන දද මැදදි සතුරට එඩි බළ                                 පෙන්නු
පාබල පුතුන් ඈත ලක්මව                                     සනසන්නු

අසූ තුනේ සිට තිස් වසරක                                    යුද්දෙ
නිමවා ලන්න ඇවිලුණු රණ වෙඩි                             සද්දේ
අතරදි බිම වැටුණු මේ විරුවන්                               මැද්දේ
නැගුන හඩ ඇසෙයි තවමත් හදවත්                          මැද්දේ



සිහිකර ඔවුන් ඉදිවන                                          ස්මාරකය
ලස්සන වෙන්න ඈත රස කවි                                  කාරකය
පාබල මවට දෙන අනුබල                                      මූලිකය
රත්නායක මැතිඳු අප සිහි කළ                                යුතුය

හමුදාපති තුමණී ඔබේ මුහුණේ නැගෙන සිනහා            රැල්ල
ඉබේ මැවී පෙනෙන්නේය මඟ පෙන්වන                  දබරැගිල්ල
පුනරුදයක අරුම කියන මේ හමුදා දියඹෙ                 රැල්ල
ඉදි වී ඈත බනි සැරයන්ලගෙ දෙමහල්                   ගොඩනැගිල්ල

පෙරට ගේන මේ පාබල කියන                                   ඇණී
කවුරුත් පුදුම වෙයි මෙහි ඇති වෙනස                         දැණී
පාබල මවට ඔබ හොඳ දරුවෙක්ද                               වුණී
කරුණාසේකර මැතිඳු අපට මහමේරුවක්                      වැණී



කවදත් යුද බිමේ පටන් නායකත්ව බලය                      පෙන්නු
රටට දැයට වැඩක් කරපු නිලදරුවන් හරි                    හපන්නු
සෙසුනිල භෝජනාගාරේ ඉදිවන තැන පෙනෙන              කුලුණු
කියා පායි අරුණෝදය පාබල මැදුරකට                       දුන්නු



සාජන්ලා වෙන්න ඉන්න කෝප්‍රල්ලාම කන්න               බොන්න
කෝප්‍රල් ක්ලබ් එක ඉදිවේ නොදැක්කනම්                 බලාගන්න
තාප්ප බැම් පවුරු වලින් ඉදිවන ලස්සන                    බලන්න
පැන්ෂන් ගිය මහත්වරුනි පනාගොඩට ඇවිත්              යන්න

සෙ/307418 කෝප්‍රල් ආනන්ද බීඑ -  20 ශ්‍රීලපාහ

# 23 ශ්‍රීලපාහ පුවත්
# බලඇණි දින සංවත්සරය

පාබල හමුදා රෙජිමේන්තුවේ නවතම සාමාජිකයකු වශයෙන් 2009.07.23 වන දින පිහිටුවන ලද 23 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව සිය පස්වන සංවත්සරය අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ ප්‍රධානත්වයෙන් මුලතිව් බලඇණි මුලස්ථාන පරිශ්‍රයේදී අති උත්කර්ෂවත් අන්දමින් සමරන ලදී.

ආගමික වතාවත්වලට මුල් තැන ලබා දෙමින් යුද හමුදාවේ සියලුම මියගිය හා අතුරුදහන් වූ සියලුම රණවිරුවන්හට පින් පමුණුවාලීමත් යුද්ධයේදී අබාධිත තත්ත්වයට පත් සියලුම රණවිරුවන්හට නිදුක් නීරෝගි සුවය ප්‍රාර්ථනා කිරීමත්, බලඇණියට හා සේවයේ යෙදී සිටින සියලුම








නිලධාරීන්, සෙසුනිලයින්, සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්හට සෙත් පැතිමඅරමුණ විය. 2014.06.15 වන දින කතරගම කදසුරිඳු අභියසදී විශේෂ පූජාවක් සහ 2014.06.23 වන දින බලඇණි ධජයට සෙත් පැතිම සඳහා ශ්‍රී දළදා මාළිගාවේ පූජාවක් පවත්වන ලදී. එමෙන්ම 2014.07.19 වන දින බලඇණි මුලස්ථානයේදී සංඝයා වහන්සේලා දෙළොස් නමක් විසින් සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පැවැත් වූහ. පසුදින ගරුතර මහා සංඝරත්නය විශයේහි හීල දානයද පිරිනැමීමද සිදු කළහ.



2014.07.23 වන දින කඳවුරු සම්මාන මුරයක් ලබාදී පසුව නිලධාරින් අට දෙනෙක් හා සෙසුනිලයින් එකසිය තිස් දෙදෙනකුගෙන් සමන්විත සම්මාන පෙළපාළිය අණදෙන නිලධාරි වෙත පිරිනැමීම කඳවුරු භූමියේදී සිදුවිය. එදිනම බලඇණියේ සියලු නිලයින්ගේ සහභාගිත්වයෙන් දිවා භෝජන සංග්‍රහයක් පැවැත් වූහ. අවසාන වශයෙන් නන්දි කඩාල් කලපු තීරයේ සංගීත සැදැවක් පවත්වා 23 ශ්‍රීලපාහ ඒකකයේ පස්වන බලඇණ දින සැමරුම නිමාව සනිටුහන් කරන ලදී.





බුද්ධි අංශය - 23 ශ්‍රීලපාහ

# 23 ශ්‍රීලපාහ පුවත්

## ක්‍රිකට් ක්‍රීඩාවට අතහිත






591 බලසේනාධිපතිගේ සංකල්පයට අනුව ප්‍රදේශයේ දමිල ළමුන්ගේ ක්‍රීඩා කෞශල්‍ය ඔප්නැන්වීමේ අරමුණින් ක්‍රිකට් තරගයක් ආරම්භ කරන ලදී. මුලතිව් වඩ්ඩුවාකල් ප්‍රදේශයේ ස්ථානගතව රාජකාරි කරනු ලබන 23 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්ලිව් ආර්එස්පී ශ්‍රීලපාහ ලද උපදෙස් අනුව මුලතිව් දමිළ මහා විද්‍යාලය හා මුල්ලියාවේලි මහා විද්‍යාලය අතර (ලෙදර් පන්දු) ක්‍රිකට් තරගයක් පැවැත්වීමට කටයුතු කරන ලදී. මහත් අපහසු තාවයන් මැද මුලතිව් නගරයේ නගරසභා ක්‍රීඩාංගනය පිළිසකර කිරීමෙන් පසු එක් පිලකට පන්දුවාර 50 ක් වූ මෙම තරගය නැරඹීම සඳහා පාසැල් දෙකේම ගුරුවරු, සිසුසිසුවියන් හා ගම්වාසින් විශාල ප්‍රමාණයක් පැමිණියහ. තරගයේ ජයහිමිකර ගැනිමට මුල්ලියාවේලි මහා විද්‍යාලීය කණ්ඩායම සමත්විය.

## සප්ත කාන්ති මාරි කෝවිලෙ වාර්ෂික උත්සවය

මුලතිව් වඩ්ඩුවාකල් සප්ත කාන්ති මාර් කෝවිලෙහි වාර්ෂික පූජා උත්සවයේදී ඒකක අණදෙන නිලධාරිගෙ සංකල්පයට අනුව ඒකක දෙවන අණදෙන නිලධාරි ටීකේපීඑම් ඩයස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාගේ පූර්ණ අධීක්ෂණ යටතේ ඒකකයේ සියලුම නිලයින්ගේ සහභාගිත්වයෙන් 2014.07.14 වන දින 1330 පැයේ සිට 1530 පැය දක්වාත් එදින 2000 පැයේ සිට 2330 පැය දක්වාත් කාලය තුළ කෝවිල වෙත පූජාවන් සඳහා පැමිණි බැතිමතුන් 2500 කට අධික පිරිසක් සදහා දිවා හා රාත්‍රී ආහාරය ලබාදෙන ලදී.

මෙම පුණ්‍යමය කටයුත්ත සඳහා 59 සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑස් ද ඉසෙඩ් වික්‍රමරත්න යූඑස්පී අයිජී ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරින් මෙන්ම සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වන ලදී.







## නව කොනොනි සමාජ ශාලාව



ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ උපදෙස් පරිදි බළඇණි කොනොනිවරුන්ගේ සුබසාධනය සඳහා නව කොනොනි සමාජශාලාවක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. මෙම කාර්යය වෙනුවෙන් දෙවන අණදෙන නිලධාරි ඇතුලු සියලුම අයවලුන් උපරිම අයුරින් කැපවී වැඩ කටයුතු සිදු කළහ. නවතමයෙන් ඉදි වූ කොනොනි සමාජශාලාවට ඇවසි බඩුභාහිරාදිය කොනොනින්ගේ ස්ව කැමැත්තෙන් භාණ්ඩ හා මූල්‍යමය වශයෙන් ලබාදුන් අතර, ඔවුන් සියලුම දෙනා මෙම මොහොතේ ප්‍රශංසාත්මකව අගය කළ යුතුය. 2014.07.23 වන දින යෙදුනු පස්වන බළඇණි දිනට සමගාමීව කොනොනි සමාජශාලා ගොඩනැගිල්ල අණදෙන නිලධාරි විසින් විවෘත කළේය.

**බුද්ධි අංශය - 23 ශ්‍රීලපාහ**

# 23 ශ්‍රීලපාහ පුවත්

## 59 වන සේනාංකාධිපතිගේ ඒකක සංචාරය

2014.07.21 වන දින 59 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් එන්ඒපීසී නාපාගොඩ යූඑස්පී අයිජී විසින් 2014.07.26 වන දින 23 ශ්‍රීලපාහ බළඇණි සංචාරය සිදු කරන ලදී. බළඇණියට පැමිණි සේනාංකාධිපති අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් පිළිගැනීමෙන් පසු සම්මාන මුරයක් පිරිනමන ලද අතර, ඒකකයේ නිලධාරීන් හඳුනා ගැනීමෙන් පසු මෙම ඒකක සංචාරය සිහිවනු පිණිස කුඹුක් පැළයක් රෝපණය කිරීමෙන් අනතුරුව අණදෙන නිලධාරි විසින් බළඇණියේ ප්‍රගතිය හා සිදු කරනු ලබන රාජකාරීන් පිළිබඳව විස්තරයන් ඉදිරිපත් කරන ලදී. අනතුරුව බළඇණි මූලස්ථානය හා රයිෆල් කණ්ඩායම් හි සංචාරය කළ සේනාංකාධිපති සියලු නිලයින් අමතන ලදී.





# 12 ශ්‍රීලපාහ පුවත්

## සම්බුදු තෙමගුල් අසිරිය

2014 වසරේ උදා වූ සම්බුදු තෙමඟුල නිමිති කරගෙන බුද්ධ රශ්මි වෙසක් කලාපය ගංගාරාම ආශ්‍රිතව පවත්වන ලදී. එම වෙසක් කලාපය සඳහා රෙම ශ්‍රීලපාහ වෙතින් 12 ශ්‍රීලපාහ ඒකකය වෙත වෙසක් කූඩුවක් නිර්මාණය කර ගංගාරාමය වෙසක් කලාපයේ ප්‍රදර්ශනය කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව වෙසක් කලාපය සඳහා අප ඒකකයට දෙවන වරටත් අවස්ථාවක් හිමිවිය. එම වෙසක් කලාපය සඳහා අප ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඩීඑස්එස් රදලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ මගපෙන්වීම යටතේ සහ අනෙකුත් අයවලුන්ගේ සහයෝගය සමගින් ඒකකයේ කලාකාමී නිර්මාණ කරුවන් අතින් ඉතා විශිෂ්ටත්වයෙන් හෙබි අලංකාර පහන් කූඩුවක් නිර්මාණය කරන ලදී. මෙම කූඩුව අඩි 15 කින් යුක්ත වූ අතර ඒම නිර්මාණය ස්වාභාවික අමුද්‍රව්‍ය යොදාගනිමින් ඉතා සියුම්ව කරන ලද නිර්මාණයක් විය. එම නිර්මාණය සඳහා හබරල කොළ 2000 ක් පමණ ද, කෙසෙල් පරඬැල්, සිප්පි කටු, ගෝනි නූල් ආදී අමුද්‍රව්‍ය තෝරාගන්නා ලදී. එහිදී වෙසක් කලාපය සතුව යුද හමුදා නිර්මාණයන් 30 ක පමණ ද, සිවිල් නිර්මාණ 200 කට ආසන්න ප්‍රමාණයක් ද නිර්මාණය කර තිබිණි. එම පහන් කූඩු සඳහා ජයග්‍රහණ ලබාදීමට පැමිණි විනිශ්චය මණ්ඩලයට සිත්ගත් පහන් කූඩුවක් වූ සාම ජාතකය නිරූපණය කරමින් ප්‍රදර්ශනය කළ අප පහන් කූඩුව සඳහා 11 වන ස්ථානය හිමිවන ලදී. එම ජයග්‍රහණය ලබා ගැනීම සඳහා උරදුන් එම කලාකරුවන් හට අප ඒකක අණදෙන නිලධාරි සහ අනෙකුත් නිලධාරි සහ සෙනින් ප්‍රාර්ථනා කලේ මෙවන් දක්ෂ තවත් නව නිර්මාණ බිහිකිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවායැයි යන්නය.

**බුද්ධි අංශය 12 ශ්‍රීලපාහ**



# ශ්‍රීලපාහ පුවත්

## බළඇණි දින සංවත්සරය



ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රථම නිත්‍ය පාබල ඒකකයේ 64 බළඇණි දින සංවත්සරය 2014.05.12 රෙම ශ්‍රීලපාහ හීඳි උත්සවකාරයෙන් සමරන ලදී.

1 ශ්‍රීලපාහ ඒකකය දශක තුනක් පුරා පැවැති කුරිරු ත්‍රස්තවාදය මුලිණුපුටා දැමීම සඳහා එහි ආරම්භයේ සිට අවසන් මානුෂිය මෙහෙයුම දක්වා දායකත්වය ලබාදෙන ලදී. දනට 53 වන සේනාංකය යටතේ 533 බළසේනා මුලස්ථානයට අනුයුක්තව පනාගොඩ රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ කඳවුරේ ස්ථානගතව විශේෂ ප්‍රභූ ආරක්‍ෂක රාජකාරි හා රජයෙන් ඉටු කරන සංවර්ධන කාර්යයන් සඳහා දායකත්වය ලබාදෙමින් කටයුතු කරනු ලබයි.



ඒකකයට පැවරි ඇති අධික රාජකාරි මධ්‍යයේ වුවද අණදෙන නිලධාරිගේ නිසි මග පෙන්වීමෙන් ආගමික කටයුතු වලට මුල්තැන දෙමින් බළඇණි දින සංවත්සරය සිදු කරනු ලබන ලදී. මාතෘ භූමිය වෙනුවෙන් සටන් බිමේදී ජීවිතය පරිත්‍යාග කළ සියලුම රණවිරුවන් හා ආබාධිත සියලුම රණවිරුවන් සිහිපත් කරමින් ඔවුන් හට සෙත් පැතීම සඳහා 2014.05.05 දින පනාගොඩ ශ්‍රී ශාක්‍යාරාමයේදී බෝධිපූජා පිංකමක් සිදු කරන ලදී. ශ්‍රී පාදස්ථානය වන්දනාමාන කිරීමට 2014.05.07 දින සිදු කළ අතර, අනතුරුව 2014.05.09 දින කතරගම දේවාලයේදී ද ආගමික වතාවත් සිදු කරන ලදී. ඒකක ධජයට හා සියලුම රණවිරුවන් වෙනුවෙන් සෙත්පැතීම, මියගිය රණවිරුවන් වෙනුවෙන් පිංපමුණුවා නිවන්සුව ප්‍රාර්ථනා කිරීම, ආබාධිත සියලුම රණවිරුවන්ට නිරෝගි ඉක්මන් සුවය, සේවයේ යෙදී සිටින සිවිල් සේවක මහතුන්ටත් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් සෙත් ප්‍රාර්ථනය මෙම ආගමික කටයුතු මඟින් සිදු කරන ලදී.

අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් හා වර්ණ ධජ සහිත සම්මාන පෙළපාළියක් 2014.05.12 දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ලබාදෙන ලදී. එදින සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් ද පවත්වන ලදී. රාත්‍රියේ **"සිටි ක්‍රික්"** සංගීත කණ්ඩායම සත්සර නදට දිවයිනේ ජනප්‍රිය ගායක ගායිකාවන් හා නර්ථන කණ්ඩායම් සමඟින් සංගීත සංදර්ශනයක් පවත්වන ලදී.

64 වන බළඇණි දිනයට සමගාමීව බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයේ සුහද හමුවක් 2014.05.22 දින අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී. මෙම සුවිශේෂි අවස්ථාවට විශ්‍රාම ගොස් සිටි බළලත් නිලධාන්, ජ්‍යෙකොනොනින් සහභාගි වන ලදී.

බළඇණි දින සංවත්සරයේදී 2014.05.23 වන දින රෙජිමේන්තු අධිපතිගේ ප්‍රධානත්වයෙන් නිලධාරි නිවස්නයේ සුහද හමුව පවත්වන ලදී. මෙම උත්සවය පාදුක්ක තෙවිනි හෝටලේදී පැවැත්වූ අතර, රෙජිමේන්තු මහ කාරක සභා ජ්‍යෙෂ්ඨ නිලධාරින් හා ශ්‍රීලපාහ ඒකකයන් හී නිත්‍ය හා ස්වේච්ඡා නිලධාරින් සහභාගි වන ලදී.

සියලු කටයුතු අවසානයේදී ක්‍රියාන්විතයේදී මියගිය හා ආබාධිත රණවිරුවන්ට සෙත් පතා 2014.05.29 වන දින සියලු නිලයන්ගේ සහභාගිත්වයෙන් ප්‍රථම වරට ලේ දන්දීමේ පිංකමක් පවත්වන ලදී. 64 වන බළඇණි දිනය සැමරූ පළවන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට අනාගතයේදීත් අභිමානයෙන් යුතුව රාජකාරි කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 1 ශ්‍රීලපාහ**





# Happy Birthday


2014 ජුලි මස 05 දින අට වන උපන් දිනය සැමරූ 25 ශ්‍රීලපාහ සෙ/303523 සැරයන් රත්නායක ටීඑම් ගේ දියණිය නිකේෂලා රත්නායක


2014 ජූනි මස 18 දින හය වන උපන් දිනය සැමරූ 20 ශ්‍රීලපාහ සෙ/314744 සැරයන් ජයලත් එම්සි ගේ පුතණුවන් ඉනුර සස්මික අනුහස්


2014 අගෝස්තු මස 01 වන දින පළමු උපන් දිනය සැමරූ 6 ශ්‍රීලපාහ සෙ/325898 කෝප්‍රල් බණ්ඩාර එච්එම්ජීඑස්කේඑච් ගේ දියණිය එච්එම් නිම්තර නවෝදනි


2014 සැප්තැම්බර් මස 27 දින හත්වන උපන් දිනය සැමරූ සෙ/2ඞ02795 කෝප්‍රල් විරසිංහ ඊඩීඑස්කේ ගේ පුතණුවන් චමෝද් මදුසංක


2014 මැයි මස 24 වන දින දෙවන උපන් දිනය සැමරූ 20 ශ්‍රීලපාහ සෙ/314744 සැරයන් ජයලත් එම්සි ගේ දියණිය කුෂලි ඔනායා සෙන්දිනි


2014 ජූනි මස 30 දින තෙ-වන උපන් දිනය සැමරූ 21 (සෙව්) ශ්‍රීලපාහ සෙ/21ඞ00341 සාසෙ තුෂාර සම්පත් එන්එම්ව් ගේ පුතණුවන් මිහින් රන්දිව් මෙත්සර


2014 අගෝස්තු මස 06 දින දෙවන උපන් දිනය සැමරූ 16 (සෙව්) ශ්‍රීලපාහ සෙ/22ඞ00440 දිසානායක ජේඑීඑන් ගේ දියණිය සනුගි දුලන්සා


2014 ජුලි මස 07 දින පළමු වන උපන් දිනය සැමරූ 17 (සෙව්) ශ්‍රීලපාහ සෙ/17ඞ00353 ලාකෝ නිර්මාල් එස්කේ ගේ දියණිය කවිත්මා වාලකි ආගිංෂනා


2014 ජුලි මස 23 දින තෙවන උපන් දිනය සැමරූ 23 ශ්‍රීලපාහ සෙ/327898 ලාකෝ සෝමරත්න එස්එස්ජී ගේ පුතණුවන් කවිශ්ක දිල්ෂාන්


2014 ජුලි මස 03 දින සිව්වන උපන් දිනය සැමරූ 7 ශ්‍රීලපාහ සෙ/325436 කෝප්‍රල් චන්ද්‍රසිරි කේජීටී ගේ පුතණුවන් දිනෙත් හිරුන්ද රශ්මික


2014 ජූනි මස 21 දින තුන් වන උපන් දිනය සැමරූ 21 (සෙව්) ශ්‍රීලපාහ සෙ/21ඞ00190 සයසෙ ප්‍රේමදාස පීඩීඑස් ගේ දියණිය නෙතුලි කවිත්මා සත්සරණි


2014 අගෝස්තු මස 29 දින පළමු වන උපන් දිනය සැමරූ 19 ශ්‍රීලපාහ සෙ/328549 ලාකෝ සඳරුවන් ඊඑම්සී ගේ පුතණුවන් නෙතුස සදපහන්


2014 ජුලි මස 24 දින දෙවන උපන් දිනය සැමරූ 23 ශ්‍රීලපාහ සෙ/305609 කෝප්‍රල් ලියනගේ පීකේ ගේ දියණිය පවනි නෙතුසරණි


2014 සැප්තැම්බර් මස 25 දින හය වන උපන් දිනය සැමරූ 19 ශ්‍රීලපාහ සෙ/306117 බනි I කේජීආර් කොඩිතුවක්කු ගේ දියණිය පහන්යා අභිමානි


2014 ජුලි මස 21 දින හත්වන උපන් දිනය සැමරූ රෙජිමුබ ශ්‍රීලපාහ සෙ/307915 බනි II වීරකෝන් ඩබ්ලිව්එම්කේජීපී ගේ දියණිය නෙත්මි අමායා


2014 සැප්තැම්බර් මස 01 දින දෙවන උපන් දිනය සැමරූ 21(සෙව්) ශ්‍රීලපාහ සෙ/21ඞ00018 කෝප්‍රල් නන්දසේන ඩීඩීජීඑස් ගේ දියණිය සෙහන්සා මිතු හසරංගි



2014 මැයි මස 10 දින එකොළොස් වන උපන් දිනය සැමරූ රෙජිමුබ ශ්‍රීලපාහ ශ්‍රීලපාහ සෙ/311054 බනි II දිලුක බීජීඩී ගේ දියණිය මුතුරංගි කෞෂල්‍යා



2014 මැයි මස 12 දින හය වන උපන් දිනය සැමරූ රෙජිමුබ ශ්‍රීලපාහ ශ්‍රීලපාහ සෙ/311054 බනි II දිලුක බීජීඩී ගේ දියණිය හංසිකා නිලක්ෂි කෞෂල්‍යා



2014 ජූලි මස 03 වන දින තෙවන උපන් දිනය සැමරූ 6 ශ්‍රීලපාහ සෙ/304759 බනි ❑ එච්ඒඑස් මුලවංශ ගේ දියණිය පබෝදි ආශා



2014 අගෝස්තු මස 07 වන දින පළමු උපන් දිනය සැමරූ 14 (සේවි) ශ්‍රීලපාහ සෙ/00383 කෝප්‍රල් නිශාන්ත කුමාර ඒකේ ගේ පුතණුවන් රන්සික



2014 අගෝස්තු මස 20 වන දින දෙවන උපන්දිනය සමරූ 12 ශ්‍රීලපාහ සෙ/323585 කෝප්‍රල් ජයවර්ධන ජේඩීඑස් ගේ පුතනුවන් ජේඩීඑස් නෙත්මින සඳකැළුම්



2014 අගෝස්තු මස 03 වන දින තුන්වන උපන් දිනය සැමරූ 10 ශ්‍රීලපාහ සෙ/324039 කෝප්‍රල් ජීවරත්න එච්කේ ගේ ආදරණීය දියණිය පුතිභා බුද්ධිනි



2014 අගෝස්තු මස 06 වන දින එකොළොස්වන උපන්දිනය සමරූ 4 ශ්‍රීලපාහ සෙ/304472 බනි II වසන්ත කේජීපීආර් ගේ පුතනුවන් සුදිල් තේජාන්



2014 අගෝස්තු මස 23 වන දින දෙවන උපන්දිනය සමරූ 10 ශ්‍රීලපාහ සෙ/317345 සැරයන් රුවන් කුමාර ඒකේආර් ගේ පුතනුවන් රැක්ෂාන් කව්ශ්ක



2014 අගෝස්තු මස 29 වන දින දෙවන උපන්දිනය සමරූ 11 ශ්‍රීලපාහ සෙ/319104 කෝප්‍රල් හෙන්නායක එච්එම්ඩීඩී ගේ පුතනුවන් යසාර රුසිරු



2014 අගෝස්තු මස 05 වන දින තුන්වන උපන්දිනය සමරූ 21 ශ්‍රීලපාහ සෙ/21ඩී00198 සාසෙ අමරසිරි එම්පීඑස් ගේ පුතනුවන් හිරෝෂ් සසංග

# Happy Birthday



2014 සැප්තැම්බර් මස 22 වන දින දෙවන උපන් දිනය සැමරූ 6 ශ්‍රීලපාහ සෙ/322649 කෝප්‍රල් වනදුසේන යූපීආර්පී ගේ පුතණුවන් සදිල්ම ආකාශ්

# මංගල සීනු



19 ශ්‍රීලපාහ ඒකකයේ නි/66056 කපිතාන් ජේඑම්බී දෙනියගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ 2013 මස ඔක්තෝබර් 30 දින රසිකා සඳමාලි මෙනවිය සමඟ ඕක් රේ රිජන්සි හිදී වාසනාවන්ත විවාහ දිවියට පා තබන ලදී.



21 (සේවි) ශ්‍රීලපාහ ඒකකයේ නි/8547 ලුතිනන් කේජීඩීඑස් කුමාර ශ්‍රීලපාහ 2014 අගෝස්තු මස 08 දින අකලංකා පුභාවි ශ්‍රියරත්න මෙනවිය සමඟ අනුරාධපුර දුල්යානා හෝටලය හිදී වාසනාවන්ත විවාහ දිවියට පා තබන ලදී.



26 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/328850 ලාකෝ කුමාර එන්ඩී 2014 සැප්තැම්බර් මස 15 දින මතුරිකා මනෝරි මෙනවිය සමඟ වාසනාවන්ත විවාහ දිවියට පා තබන ලදී.



21 (සේවි) ශ්‍රීලපාහ ඒකකයේ සෙ/21ඩී00332 සාසෙ රණසිංහ ඒආර්ඩී 2014 ජූනි මස 30 දින චමිලා ප්‍රියදර්ශණී මෙනවිය සමඟ අම්පාර නානායම හිදී වාසනාවන්ත විවාහ දිවියට පා තබන ලදී.



26 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/324913 ලාකෝ සෙනවිරත්න එම්එම්අයිකේ 2014 සැප්තැම්බර් මස 18 දින නිලක්ෂි සමුදරා මෙනවිය සමඟ වාසනාවන්ත විවාහ දිවියට පා තබන ලදී.

# අළු යට ගිනි

නාගදීපේ ළඟ පෝළිම හුඟක් ඇවිත් පසු යුද්දෙට
ඒ නිදහස යලි බිඳින්න දෙන්න එපා වෙඩි උණ්ඩෙට
කොටින් නොවෙයි සිහල කොටින් ගැනත් හිතමු සහ සුද්දෙට
අළු යට ගිනි තියෙයි තවම දෙන්න එපා ගිනි ගන්නට

නව දළු ලා හැදුනු කරටි
යලිත් කරනු එපා කිලිටි
වැදුනොත් සැර විදින මල්ටි
තල් ගස් යලි ගහයි බල්ටි

දිලිසෙයි අද ගෙතුණු මාල
ද්‍රවිඩ ලියන් ගෙලෙහි බාල
හැඩ වැඩ වී කරයි කෝල
වේන්ඩාමි සයනයඩි මාල

හදපු රේල් පාර පෙනෙයි ලස්සන කිලිනොච්චි යන්න
ඉස්සර වගෙ යලිත් උන්ට දෙනවද අපි ගලවා ගන්න
දස දහසක් දිවිත් පිදුවේ රට දැය සුරැකලා දෙන්න
කුරිරු යුද්දෙ අමතක නම් දෙන්නද නියඟලා කන්න

මිරිඟු දියත් පෙනෙයි දුරට පෙනෙයි ඒ නවයේ පාර
දුරට පෙනෙයි එක එල්ලෙට දිලිසෙන විට පාරේ තාර
බෝම්බයෙන් මර උගුලෙන් හාරාගෙන යලිත් පාර
උතුර දකුණ නැති විරසක හදන්න දත කනව මාර

මේජර් ඊඩී ගුණරත්න ආර්එස්පී
2 වන අණදෙන නිලධාරි–14 (සේවී) ශ්‍රීලපාහ

# මාගේ ආදරය

යෞවනය කැප කරන්
රුදුරු ගිනි අවිය අත දරන්
රැයක් දවාලක් නොනිදා
කුසට අහරක් නොලබාම
දිවි නොතකා සටන් වදින
නුඹේ පෙම්වතා........

කෝප්‍රල් ලක්සිරි කේබී
19 ශ්‍රිලපාහ සී කණ්ඩායම

# දූව

පෝරුව මත නුඹ ඉන්න කොට
අප්පච්චිගේ සිත පිරුණා දූවේ
කැඳලි තනන්නට නුඹ ගියාද සිට
අපේ පැල්පත පාලුයි දූවේ
අම්මා මල්ලි නුඹ සිහිකර
සතුටු කඳුළු වගුරනවා දූවේ
නුඹ කුළගෙට මගේ දෝණිට
සුර විමනක් නේද දූවේ
සිදේවිය වී නුඹ සාමය සමගිය සැමදා
රැක ගනින් දූවේ
අප්පච්චි සිතින් සැමදා
නුඹ ළඟයි රත්තරන් දූවේ

ලාකෝ අජිත් කුමාර ඒපීඑන්
ඒ කණ්ඩායම 15 ශ්‍රීලපාහ

# මුර කුටියේ ගිනි අවියක උරුමේ

පාළු ගණ කැලයේ
ගුරුපාරේ ලඳු කැලෑවක අයිනේ
ගිනි අවිය තිබද තුරුලේ
දිවා රෑ නොනිදා නිදි වරව
නෙතු පියන්පත් විඩා බරව
සෙබළ නෙතු දිනෙන් දින
අවදිව සිටියේ සිවිල් ගැමි
දිවි තිබද රැකුමයි
සදාලක් මැණි සැමගේ
සෙනෙහෙ බර විය
සටන් වැද දිනූ දේශය
සැමට උරුම විය
නැත කිසිදු දිනෙක ජාතිබේද
වනුයේ උපන් පිංබිම දෙකට
නෙවුනේ සෙබළ සිත් නොපසුබට
උත්සාහයෙන් ලක් මව්බිම රැකුමට
සෙබළ පුත දිනෙන් දින
ජනිත වනුයේ ජාතියේ නාමයෙනි.

ලාකෝ බංඩාර ජේඑම්ඩී
ඒ කණ්ඩායම 15 ශ්‍රීලපාහ

# සෙබළ සොයුර

එඩිතර වූ විරුවා නුඹ කළ විස්කම් මවිත
ලොවටම නැගෙයි දිවිදුන් උර දී පසුව
මහ කැලයේ රුදුර වෙස් ගත්තත් අරුම
ආපසු හැරුණේ නෑ ඔබ උන් හට බියවී
ගම්දොර නෑසියන් හා නිති දිවි ගෙවීම
පසෙකට තබා නුඹ ගියේ සටනට...
ඉපදුන රටට නිරතුරු මෙහෙවර කෙරුම
එයමයි විරුව නුඹ හට තිබූ සැනසීම
නුබ එඩිතර කමයි සිංහල කමයි සිතේ
එයමයි ලක් දෙරණ ජය ඉතිහාසේ
පෙර විරුවන්ගේ මතක රැඳී සුවඳ දිගේ
ඔබ ගිය මගේ පා සටහන් රැඳී තිබේ

ආසෙ අත්තනායක ඒඑම්කේඩබ්ලිව්
ඒ කණ්ඩායම 15 ශ්‍රීලපාහ




# දෙමාපියන්

වද විද එදා දස මස මා රැක අම්මා
පාදයෙන් පාදය තැලවිලි ගීයෙන් නම්මා
සඳහරු දිරිය අපහට කැටි කළ පෙම්මා
අද නොව මතු දිනෙක සම්මා සම්බුදු වේවා
විරු තෙද බලය පියතුම දෙව්දූ වෙස
කරුණා දයා ගුණ ගැබෙහි මවක ලෙස
පියතුම සුවද දෝතින් ගත් පියුම ලෙස
නමදිමි දෙපා හද බැතියෙන්
ඔබ හට මෙලෙස

ලාකෝ බංඩාර ආර්එම්ඩී
ඒ කණ්ඩායම 15 ශ්‍රීලපාහ

# උත්සාහය

ධනය විනාශ වීමෙන්
බොහෝ දේ විනාශ වී යයි
මිතුරන් නැති වීමෙන්
බොහෝ දේ නැතිවී යයි
ඒත් උත්සාහය නැති වූ විට
සියළු දේ නැතිවේ
අනුවත් ක්‍රමයෙන් පටන් ගෙන
කෝපය පසුතැවිල්ලෙන් හීන වේ
බුද්ධ ධම්ම සඝ සරණෙන්
නතු වීමෙන් ඔබගේ
ජීවිතය ජයෙන් ජයම වෙයි

ලාකෝ චන්දිමාල් ඒයජීජීඑස්
ඒ කණ්ඩායම 15 ශ්‍රීලපාහ

# 24 ශ්‍රීලපාහ පුවත්

## පාඨමාලාවෙන් දස්කම් පෑ නිලධාරී



නි/67420 ලුතිතන් එච්එම් රාජපක්ෂ ආර්එස්පී ශ්‍රීලපාහ

සියලු හැකියාවන්ගෙන් පිරිපුන් සැබෑ සෙබළෙකු බිහිකිරීමේ අදිටනින් ශ්‍රී ලංකා යුද හමුදාවේ පාබල හටපිරිස් වෙත අධියර කිහිපයකින් දීර්ඝ කාලසීමාවක් පවත්වනු ලබන විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලාවකි. එහි අංක 49 වන පාඨමාලාව 2014.03.10 දින සිට 2014.07.10 දින දක්වා හදාරනු ලැබූ මෙම ඒකකයට අයත් නි/67420 ලුතිතන් එච්එම් රාජපක්ෂ ආර්එස්පී ශ්‍රීලපාහ විසින් ආරක්‍ෂක සේනා මූලස්ථාන පහක නිලධාරින් 17 ක් හා සෙසුනිලයින් එකසිය අනූ පහක් අතුරින් සෑම අංශයකින්ම විශේෂ දස්කම් ලබා ප්‍රථම ස්ථානය ලබාගෙන ඇත.

මෙසේ සමස්ත පාඨමාලාවේ ප්‍රථම ස්ථානය ලබාගත් ඔබ අප ඒකකයට අභිමානයකි. ශ්‍රීලපාහ රෙජිමේන්තුවට අභිමානයකි. ඔබ වැනි පාබල තරු ශ්‍රී ලංකා පාබල මාතාවට මහත් අභිමානයකි. ඔබ දහඩිය හෙලා දුක්කම්කටොලු ජයගෙන ලබාගත් දැනුමෙන් ඉදිරි යුද හමුදා ගමන යන්නට අවැසි ශක්තිය ධෛර්යය නොඅඩුව ලැබේවායි අණදෙන නිලධාරී ඇතුලු ඒකකයේ සියලු දෙනාගේම ඒකායන ප්‍රාර්ථනයයි.

## ඒකකයේ නව කොනොනි සමාජ ශාලාවක්









වව්නියාව පුදුක්කුලම් ප්‍රදේශයේ ස්ථානගතව සිටින මෙම ඒකකයට ස්ථිර කොනොනි සමාජශාලාවක් නොමැතිවීම හේතුවෙන් අණදෙන නිලධාරී ගේ උපදෙස් මත කොනොනි සමාජශාලාවක් අභිනවයෙන් ඉදි කිරීමට මුල්ගල තබන ලදී.

ඉතාමත් කෙටි කාලසීමාවක් තුළ අංග සම්පූර්ණ කොනොනි සමාජශාලාවක් ලෙසින් ඉදිකිරීම් කටයුතු නිමකර ගැනීමට අණදෙන නිලධාරී ඇතුලු ඒකකයේ සියලුම නිලධාරීන් ද, රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු සියලුම ජ්‍යෙකොනොනින් ද, ලබාදුන් උපදෙස් හා දායකත්වයෙන් හැකි විය. ඒකකයේ සියලුම කොනොනීන්ගේ එකමුතුකමෙන් හා ශ්‍රමදායකත්වයේ මහගු ප්‍රතිඵලයක් ලෙස යුද හමුදා ප්‍රතිපාදන වැය කිරීමකින් තොරව බල ප්‍රදේශයෙන් අවශ්‍යතා සපුරා ගෙන මෙම කාර්යය සිදු කිරීමට හැකි විය.

2014.08.11 දින 24 ශ්‍රීලපාහ පුදුක්කුලම් කඳවුරට තවත් එක් ස්වර්ණමය මතක සටහනක් එක්කරමින් 0910 පැයට යෙදුන සුබ මොහොතින් ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එස්එන්එම්ජ්බී අරඹේපොල ශ්‍රීලපාහ ගේ සුරතින් කොනොනි සමාජශාලාව විවෘත කර කොනොනින්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදෙන ලදී.

**බුද්ධි අංශය - 24 ශ්‍රීලපාහ**

# පාබල හමුදා තරු

## දැනුමෙන් පුහුණුවෙන් පෙරමුණට



ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ නාමය බැබලෙව් ජ්‍යෙෂ්ඨ කොනොනියෙකි සෙ/318298 සැරයන් බණ්ඩාර වයිආර්ආර්එස් - ආර්ඩබ්ලිව්පී දූනට 1 ශ්‍රීලපාහ ඒකකයේ රාජකාරී කරනු ලබයි.

මොහු 2004.05.18 වන දින ශ්‍රී ලංකා යුද හමුදා බැදී ආධුනික පුහුණු පාඨමාලාව සාර්ථකව නිමකර 2004.12.02 දින 1 ශ්‍රීලපාහ ඒකකය වෙත ඇතුලත්ව මේ දක්වා ඒකකයේ රාජකාරී කරනු ලබයි. ක්‍රියාන්විතයේදී දක්වන ලද දක්ෂතා හේතුවෙන් රණ වික්‍රම පදක්කමින් පිදුම් ලබා ඇත. ඒකකය සමඟින් රාජකාරී සිදු කරන අතර, පාඨමාලා රැසක් හදාරා විශිෂ්ට ප්‍රතිඵල ලබාතෙන ඇත.

2006.02.06 දින සිට 2006.03.15 දින දක්වා ආසේමු (ව) යටතේ පවත්වන ලද විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලාව - තෙවන ස්ථානය, 2010.1019 දින සිට 2010.12.28 දින දක්වා සපුපා අම්පාර වෙතින් පවත්වන ලද කැලෑබද සටන් පුහුණු පාඨමාලාව - ප්‍රථම ස්ථානය, 2012.04.02 දින සිට 2012.05.26 දින දක්වා ඉන්දියාවේ පවත්වන ලද කැලෑබද සටන් පුහුණු පාඨමාලාව, 2014.05.06 දින සිට 2014.08.06 දින දක්වා පාපුම මින්නේරිය වෙතින් පවත්න ලද ජ්‍යෙෂ්ඨ කොනොනි යුද උපක්‍රම පාඨමාලාව - ප්‍රථම ස්ථානය යන පාඨමාලාවන් හදාරා ශ්‍රීලපාහ රෙජිමේන්තුවට මෙන්ම 1 ශ්‍රීලපාහ ඒකකයට ගෞරවයක් ලබාදී ඇත.

මෙවන් දක්ෂතා හිමිකර ගනිමින් 1 ශ්‍රීලපාහ ඒකකයේ ජ්‍යෙෂ්ඨ කොනොනියෙකු වශයෙන් විශිෂ්ට දක්ෂතා අන් අයට ද ආදර්ශයකි. ඔබට අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් එක්කරන්නෙමු.

---

## නර්තනයෙන් පෙරමුණට



රෙජිමේන්තු තූර්ය වාදක අංශයේ රාජකාරී කරනු ලබන සෙ/329810 ලාන්ස් කෝප්‍රල් ප්‍රේමදාස යූඑච්ජීසීඑම් 1 ශ්‍රීලපාහ ඒකකයට අයත් කොනොනියෙකි. මොහු මහනුවර හිද්දවුල්ල කණිෂ්ඨ විද්‍යාලය වෙතින් අධ්‍යාපනය හැදෑරූ මොහු මහනුවර ස්වර්ණජෝති ජාතික පාසල වෙත ඇතුලත්ව අධ්‍යාපන කටයුතු සිදු කරමින් තම නැටුම් අධ්‍යාපනය හදාරා ඉන් අනතුරුව උඩුනුවර ලංකාතිලක මහ විද්‍යාලය වෙතින්ද, සමස්ත ලංකා නර්තන තරග දෙකකින් ජාතික මට්ටමේ ප්‍රථම ස්ථානය හිමි කරගන්නා ලදී. ජාතික තරුණසේවා සභාවේ බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනයෙන් ලලිත කාලාවේදී ඩිප්ලෝමාව, උඩරට, පහතරට, සබරගමු හර්ථ නර්තනය සහ රබන් කරකැවීමේ ශිල්ප පිළිබඳව හසල දැණුමක් ලබා ඇත. ලංකාතිලක මහ විද්‍යාලයේ ස්වේච්ඡා ගුරුවරයෙකු වශයෙන් සේවය කර 2010.06.02 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැදී ආධුණික පුහුණුව ලබා 1 ශ්‍රීලපාහ ඒකකයට ඇතුලත්ව ඇත.



රෙජිමේන්තු තූර්ය වාදක අංශයේ නර්ථන කණ්ඩායමේ දූනට රාජකාරී කරනු ලබයි. තම දක්ෂතාවයන් දිනෙන් දින වර්ධනය කරගනිමින් 2014 මහනුවර ඇසල පෙරහැර දී නර්ථන ශිල්පයෙක් වශයෙන් සහභාගි වී ජනාධිපති සම්මාන ලබා ඇති බැව් ආඩම්බරයෙන් යුතුව සඳහන් කරන්නෙමු.



තම කලා ජීවිතයේදී ලබාගත් ජයග්‍රහන ලෙසින් නෛයනඩි නර්ථන ශිල්පි වශයෙන් 2007, 2008, 2009, 2011 වර්ෂයන් ද, කුසලතා පූර්ණ වෙස්නැටුම් ශිල්පි වශයෙන් 2012, 2013 වර්ෂයන් ද, විශිෂ්ට වෙස් නැටුම් ශිල්පි වශයෙන් 2014 වර්ෂයේද, මහනුවර ඇසල පෙරහැරට සහභාගි වී ජනාධිපති සම්මාන ලබාගෙන ඇත. එමෙන්ම 2008, 2009, 2010 වර්ෂයන් වලදී ඇමරිකන් ෆ්‍රේස්ටිවල් තරගාවලියන් වලදී රන් පදක්කම් හිමිකරගෙන ඇත.

මොහු විසින් මේ දක්වා ලබා ඇති ජයග්‍රහණ ඉදිරියටද ලබාගැනීමට වාසනාව ශක්තිය ධෛර්ය ලැබේවායි 1 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලයින් විසින් ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 1 ශ්‍රීලපාහ**

# 7 ශ්‍රීලපාහ පුවත්

## බලඇණි පුහුණුවීම්

මෙම ඒකකය බලඇණි සාමුහික පුහුණුවීම් 57 සේමු බලඇණි පුහුණු පාසලේදී දින තිස් හයක් පුහුණුවීම් ඒකක හටපිරිස් සිදු කිරීමට අවස්ථාව හිමි විය. බලඇණියේ දක්ෂතා හා කුසලතාවයන්ගෙන් හෙබි උපදේශක මඩුල්ලක් යටතේ පුහුණුවීම් සිදු කිරීමට නටයුතු කරන ලදී. ඒකක අණදෙන නිලධාරි නි/63017 ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ සහ දෙවන අණදෙන නිලධාරි නි/63049 මේජර් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ යන නිලධාරින් ගේ අධීක්ෂනයෙන් පුහුණුවීම් කටයුතු ආරම්භ කරන ලදී.

බලඇණි පුහුණුවීම් ආරම්භ කරමින් 2014.07.01 දින 574 බලසේනාධිපති බ්‍රිගේඩියර් එච්ආර්එම්ආර්බීටී හත්නාගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ආරම්භක දේශනය සිදු කරන ලදී.



පාඨමාලාව ආරම්භයේ සිටම උනන්දුවෙන් හා කැපවීමෙන් සාර්ථකව පාඨමාලාව හැදෑරූ ඒකක හටපිරිස් මේ සඳහා නිලධාරින් 14 ක් හා සෙසුනිලයින් 364 ක් සහභාගි විය. ක්‍රියාන්විතයක කුඩාම කොටස වන තිදෙනෙකුගේ යුත් කණ්ඩායමේ සිට බලඇණියක් දක්වා ක්‍රියාන්විතයක නියලීමේදී පිළිපැදිය යුතු මූලධර්ම හා ප්‍රායෝගිකව මුහුන දුන් හා මුහුන දීමට සිදුවන වැදගත් සංදිස්ථානයන් අලලා පුහුනුවීම් සිදු කරන ලදී. මෙහිදී ජීව වෙඩි තැබීම්ද සිදු කරන ලදී. බලඇණි පුහුණුවීම් අවසානයේ අණදෙන නිලධාරි විසින් සැලසුම් කළ බලඇණි ක්‍රියාන්විතය සිදු කරන ලදී.

''පුහුණුවේදී හෙලන ලද දහදිය යුද්ධයේදී රන්මුතු වේ''යන වදනේහි අරුත වඩාත් හොඳින් අවබෝධ කරගෙන සිටි මෙම ඒකක හටපිරිස් ආසේමු (කිලි) ආඥාපති, 57 සේනාංකාධිපති, 571 බලසේනාධිපත සහ සියලුම උපදේශකයින්ගෙන් ලද පැසසුම් ලබමින් බලඇණි පුහුණුවීම් 2014 අගෝස්තු මස 07 වන දින අවසන් කරන ලදී. පාඨමාලාවේ අවසන් දේශනය 57 සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්ජේ සෙනවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් සිදු කරන ලදී. එහිදී අදහස් දැක්වූ 57 සේනාංකාධිපති විසින් ප්‍රකාශ කර සිටියේ පාබල සෙබළුන්ගේ මූලික දැනුම වර්ධනය කරගැනීමට ලැබුනු අවස්ථාවෙන් හටපිරිස් විසින් උපරිම ප්‍රතිඵල නෙලා ගෙන ඇති බවත්, ඒ බැව් ලබාගත් සමස්ත ලකුණු ප්‍රතිශතය පැහැදිළි බවත්, සෑම සෙබළෙකුම උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට උත්සහ කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. එහිදී පාඨමාලාවේ හොඳම කණ්ඩායම බී කණ්ඩායම, දක්ෂතම නිලධාරි අණදෙන නි/64468 ආර්ජ්ජ් රණවක ආර්එස්පී ශ්‍රීලපාහ, දක්ෂතම බණ්ඩභාර නිලධාරි නි/68804 ලුතිතන් ජීකේජීපීඑස් බණ්ඩාර ශ්‍රීලපාහ, දක්ෂතම වෙඩිකරු සෙ/316988 සැරයන් වික්‍රමසිංහ ඩබ්ලිව්ජීජ්, දක්ෂතම ශාරීරික යෝග්‍යතා සෙබළා සෙ/328308 ලාකෝ ජයන්ත එස්ජ්එස්, දක්ෂතම පෙළ අණදෙන්නා සෙ/312308 කෝප්‍රල් හේමචන්ද්‍ර යූජීඑස්කේ, සෑම අතින්ම අතිශූර සෙබළා සෙ/324796 සාසෙ කරුණාරත්න ඩීඑම්කේ යන කණ්ඩායම් හා අයවලුන් විසින් දක්ෂතා දක්වා කුසලාන හා සහතිපත් 57 සේනාංකාධිපති වෙතින් ලබා ගන්නා ලදී.

එදිනම මෙම ඒකකයේ අයවලුන්ගේ මූල්‍යමය හා ශ්‍රම දායකත්යවයෙන් නවතමයෙන් ඉදි කළ සෙසුනිල හා කොනොනි භෝජනාගර ගොඩනැගිල්ල විවෘත කර පුහුණු පාසල වෙත පරිත්‍යාග කිරීමද 57 සේනාංකාධිපතිගේ සුරතින් සිදු විය.

**බුද්ධි අංශය - 7 ශ්‍රීලපාහ**



# ඔහොමම යං

| | | | |
|---|---|---|---|
| තිස් වසරක් තිබුණු යුදගිනි | දුමාරය | රට සරු කරන්නට ලෝකෙට ණය | වෙද්දෙන් |
| තුන් අවුරුද්දකින් ඔක්කොම | හමාරය | හැම මැතිවරණයම කවදත් ජය | ලද්දෙන් |
| මුළු රට පුරා සුර පුරකට | සමානය | එය සහතිකයි පැවසිය යුතු සහ | සුද්දෙන් |
| දෙවියන් පවා එයි හැරදා | විමානය | අසරණ එකා නිතරම කඳුළැලි | බොද්දෙන් |
| කැක්කුම් දැනෙන්නේ ඇති අයටය | වනය | සැප සම්පත් ලැබේ යුද බිය නැසුන | ගමන් |
| සමහරු දෙවියනි නිතරම වැදි | බනය | හිතවත ලෙහෙසි වුනේ නෑ අප හිතන | තරන් |
| යන්නේ නිතරම නැති බැරි අයගෙම | පනය | කරදර කම්කටොලු බාධක හදට | අරන් |
| කාලය විසදවි කොයි කවදත් | පැනය | හමුවෙන තුරා ජය බිම ඉදිරියට | යමන් |

**සෙ/325936 සාසෙ නිරෝෂන් කේජීඑස් - 'ඒ' කණ්ඩායම 7 ශ්‍රීලපාහ**

# 19 ශ්‍රීලපාහ පුවත්

## නව බුදු මැදුරක්

ඒකක අණදෙන නිලධාරීගේ මගපෙන්වීම යටතේ නිලධාරී සහ සෙසුනිලයින්ගේ ශ්‍රමදායකත්වයෙන් අභිනවයෙන් බුදු මැදුරක් ඉදිකරන ලදී. එහි අඩි 4 1/2 ක් උස බුදු පිළිමයක් නිර්මාණය කර නේත්‍රා තැබීමේ මහා පිංකම 2014.07.26 වන දින උදෑසන 0422 පැයට යෙදුන සුබ මොහොතින් මහා සංඝයා වහන්සේලා දෙනමක් වැඩමකර පිරිත් සජ්ඣායනා මධ්‍යයේ සිදු කරන ලදී.

එදින උදෑසන 0600 පැයට සධාතුක කරඬුව ප්‍රමුඛ මහා සංඝයා වහන්සේලා පෙරටුකරගත් කිරිපිඩු දානමය බුද්ධ පූජාව රැගත් පෙරහැර දෙවන අණදෙන නිලධාරී නිල නිවාසය අභියසින් ආරම්භකර බුදු මැදුර වෙත වඩම්මවන ලදී. බුද්ධ පූජාව නව බුදු මැදුරේදී පවත්වා පිං අනුමෝදං කළේය.

මහා සංඝයා වහන්සේ උදෙසා හීල් දානය සහ පිරිකර 0730 පැයට පූජාකරන ලදී. දහවල් බුද්ධ පූජාවද 1030 පැයට සිදු කර මහා සංඝයා වහන්සේ උදෙසා දහවල් දානය හා පිරිකර පූජාකරන ලදී.









## නව මුළුතැන් ගෙයක්

මෙම ඒකකය නව ස්ථානගතවීමත් සමගම මුලංකාවිල් මුලස්ථාන කඳවුරේදී අණදෙන නිලධාරී ගේ මග පෙන්වීම යටතේ නිලධාරී සහ සෙසුනිලයින්ගේ ශ්‍රමදායකත්වයෙන් අභිනවයෙන් ප්‍රධාන මුළුතැන්ගෙයක් ඉදිකිරීමට සැලසුම් විය. ඒ අනුව ඉතා කෙටි කාලයක් තුළදී සැමදෙනාගේ කැප කිරීම මත අංග සම්පූර්ණ මුළුතැන් ගෙයක් ඉදි කර 2014.07.28 වන දින 0512 පැයට යෙදුන සුබ නැකතින් ලිප ගිණි මොලවා කිරි ඉතිරවීමෙන් පසු ඒකක අණදෙන නිලධාරී ගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.

**බුද්ධි අංශය - 19 ශ්‍රීලපාහ**





# ක්‍රීඩා පුවත්







## අන්තර් රෙජිමේන්තු කබඩි තරඟාවලිය - 2014

ශ්‍රී ලංකා යුද හමුදා කබඩි කමිටුව විසින් සංවිධානය කළ යුද හමුදා අන්තර් රෙජිමේන්තු කබඩි ශුරතා තරඟාවලිය 2014 ගජබා රෙජිමේන්තු ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී සැප්තැම්බර් මස 22 දින සිට 26 වන දින දක්වා පවත්වන ලදී.

ශ්‍රීලපාහ රෙජිමේන්තුව වෙතින් ඉදිරිපත් කළ කණ්ඩායම දක්ෂතම අට දෙනාගේ කාණ්ඩයෙන් තරග වැදුණු අතර, මූලික වටයේදී යාපාබ, ශ්‍රීලවියාඉ හා ශ්‍රීලයුයුබ රෙජිමේන්තු කණ්ඩායම් සමඟින් තරග වැදී ප්‍රතිවාදි කණ්ඩායම් පරාජයට පත් කරන ලදී. ලැබූ ජයග්‍රහන අනුව අර්ධ අවසන් පූර්ව තරඟය සඳහා සුදුසුකම් ලැබීය. එහිදී ශ්‍රීලයුපොහේබ රෙජිමේන්තු කණ්ඩායම සමඟින් තරඟ කළ ශ්‍රීලපාහ ක්‍රීඩකයෝ ලකුණු 24/14 ක් ලෙසින් ජයග්‍රහනය කර අවසන් පූර්ව තරගයට සුදුසුකම් ලැබූහ. රෙම ශ්‍රීලයුසසබ සමග තරග ලකුණු 23/12 ලෙසින් ජයග්‍රහණය හිමි කර අවසන් මහ තරගය සඳහා ශ්‍රීලයුපොදුසේබ සමඟින් 2014 සැප්තැම්බර් මස 26 දින පවත්වන ලදී. එහිදී අප කණ්ඩායම ඉතාම දක්ෂ ලෙස තරග කල අතර ඉතාම තියුණු තරගයකින් පසුව ලකුණු 21 ට 21 ක් ලෙස සම ලකුණු හිමි කර ගන්නා ලදී. කබඩි ක්‍රීඩාවේ නීතිරීති අනුව දෙපිලෙම ක්‍රීඩකයන් 05 දෙනෙකු නම් කර එක ක්‍රීඩකයකුට එක අවස්ථාව බැඟින් ප්‍රතිවාදි පිල ආක්‍රමණය කිරීම සිදු විය. එහිදී ප්‍රතිවාදී කණ්ඩායම 7/4 ලෙස තියුණු තරගයකින් අනතුරුව ජයග්‍රහණය හිමිකර ගැනීමෙන් 2014 අන්තර් රෙජිමේන්තු කබඩි තරගාවලියේ සමස්ත අනුශුරතාවය ශ්‍රීලපාහ ක්‍රීඩකයින් විසින් දිනා ගන්නා ලදී. තරගාවලිය පුරාවටම දක්වන ලද දක්ෂතා හේතුවෙන් සෙ/330093 සාසෙ ඩැනියල් කේපීජ් ක්‍රීඩකයා තරගාවලියේ හොඳම ප්‍රතිවාදී පිල ආක්‍රමණික ක්‍රීඩකයාට ලෙසින් කුසලාන හිමි වන ලදී. මෙම ජයග්‍රහණය ශ්‍රීලපාහ රෙජිමේන්තුවට ගෞරවයක් මෙන්ම මහත් ආඩම්බරයකි.

**ක්‍රීඩා අංශය රෙම ශ්‍රීලපාහ**

## මාතොටින් එන උතුරු සුළඟේ ගිනි සිඹින මඩු පල්ලියේ දෑස් අග මුදු කඳුළු හංගන සරෝජා මගෙ දෝණියේ...

මගේ චූටි දෝණි එදා කඳුළු සැළුව සරෝජලා අද සිනා සෙන්නේ ඔයාගේ ඔය දෑස් වල තියෙන කඳුළු වලිනුයි. මගේ පුතේ ඔයාට අද දවසේ පිය සෙනෙහස ඒ උණුසුම අහිමි වුණේ ඒ නිසයි. ඔයාගේ පියා එදා ජීවිතය පූජා නොකළා නම් ඒ සරෝජලා තවමත් අඬනවා...

රත්තරං දූවේ අද මේ ශ්‍රී ලංකාවේ දස ලක්ෂ ගණනක් ජනතාවගේ සතුට වෙනුවෙන් ඔයාගේ පියා වගේ තවත් මාමලා දස දහස් ගණනක් ජීවිත වලින් වන්දි ගෙව්වා. ඔයා වගේ නංගිලා, මල්ලිලා, අයියලා ,අක්කලා තවමත් අඬනවා. නමුත් ඔයාලා වීර පියවරුන්ගේ ලෙයින් උපන් සූරවීර දරුවෝ මගේ චූටි දෝණිත් දූන් වීර දියණියක්. ඔයාගේ වයසේ ළමයි දෙමාපියන් සමඟ සතුටු වන විට ඔයාගේ අතක් හුදකළා වෙන විට මගේ චූටි දෝණිට දුක හිතෙයි. ඒත් පුතේ මහ මෙරක් සේ පුතාගේ මෑණියන් පුතා ළඟ ඉන්නවානේ. පුතේ ඔයාගේ පියා මියයන්නේ නෑ **"සදා අමරණියයි"** යුද බිය දුරු වී දසතම සාමයේ මල් පිපෙන විට ඔයාගේ දෑසේ කඳුළක් ඉතිරි වෙලා නේද? රත්තරං පුතේ ඒ කඳුළ පිස දමන්න. පුතාගේ ආදරණීය පියා ඔයා දෙස හැමදාම බලන් හිඳීවි ඔයාට හැමදාමත් ආරක්ෂාවක් වේවි. ආදරණීය චූටි දෝණි ඔයා රටට ජාතියට වැඩදායක ආදර්ශමත් ගුණගරුක දරුවෙකු වෙන්න. ඒකයි මගේ ප්‍රාර්ථනාව. දුවට බුදු සරණයි. දෙවි පිහිටයි.



**සෙ/315995 සැරයන් ප්‍රසාද් ඩබ්ලිව්ජ්එස් ආර්එස්පී - රෙජිමූබ ශ්‍රීලපාහ**

# රනින් ජයගත් පාබල පුතුන්



වසර 30 කට අධික කාලයක් අප මාතෘභූමිය ඊළාම් ත්‍රස්තවාදයේ ග්‍රහණයෙන් මුදාගැනීම සඳහා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව යටතේ රාජකාරී කරන ලද කාය දානයෙන් කැප වූ පාබල විරුවන් වෛද්‍ය වර්ග කිරීම් මත රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ශ්‍රීලපාහ වෙත ඇතුලත් කරන ලදී. තමන්ගේ නොහැකියාවන් පසෙකලා ඔවුගේ හැකියාවන් අනුව විවිධ පුනරුත්ථාපන කටයුතු සඳහා යොමුවිය. එසේ තම හැකියාවන් වර්ධනය කරගත් ක්‍රීඩයන් 157 දෙනෙකුගෙන් සමන්විත වන රෙජිමූබ ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායම රණක්ෂිතයට පත් රණවිරුවන්ගෙන් ස්වල්ප දෙනෙකි. මෙම ක්‍රීඩා කණ්ඩායම අණදෙන නිලධාරිගේ මනා මග පෙන්වීම යටතේ නිලධාරි අණදෙන වරයෙකු හා බළලත් නිලධාරිවරයෙකු යටතේ මනා කැපවීමෙන් හා ධෛර්යයෙන් යුතුව ක්‍රීඩා කටයුතු සිදු කරනු ලබයි.

යුද්ධ හමුදාවේ රණක්ෂිතයට පත් රණවිරුවන් සිටින සෑම රෙජිමේන්තුවක්ම වසරකට වරක් එම විරුවන්ගේ දක්ෂතාවයන් ඔප්නැංවීම සඳහා මහත් උත්කර්ෂවත් අන්දමින් යුද හමුදා පැරා තරගාවලිය පවත්වනු ලබයි. මේ සඳහා ආබාධිත ක්‍රීඩකයන් සඳහාම විශේෂිත වූ නිති මාලාවක් ඔස්සේ විවිධ තරග ඉසව් ක්‍රියාත්මක කරනු ලබයි. 2014 වසරේ පැවති 17 වන යුද හමුදා පැරා ක්‍රීඩා උළෙලේ තරග ඉසව් දිවයිනේ විවිධ ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් විවිධ රෙජිමේන්තුවල අලංකාරවත් ලෙසින් සංවිධාන කටයුතු සිදු කරන ලදී. රෙජිමේන්තු 13 ගේ සහභාගිත්වයෙන් කණ්ඩායම් තරග 14 ක් හා අවසන් මළල ක්‍රීඩා උළෙල ද ඉතා අලංකාරවත් අයුරින් පවත්වන ලදී.

17 වන යුද්ධ හමුදා පැරා තරගාවලියේ සුවිශේෂී අවස්ථාව වන අවසන් මළල ක්‍රීඩා උළෙල 2014 අගෝස්තු 20 දින සිට 22 වන දින දක්වා සුගතදාස ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේදී විදේශ රටවල් 05 ක ක්‍රීඩකයින්ගේ සහභාගිත්වයෙන් යුතුව යුද්ධ හමුදාධිපති තුමාගේ සංකල්පයට අනුව පවත්වන ලදී.

අවසන් මළල ක්‍රීඩා උළෙලේ විශේෂ දස්කම් දක්වමින් ශ්‍රී ලංකා පාබල හමුදා විරුවන් තමන්ගෙන් ගියවර ගිලිහි ගිය මළල ක්‍රීඩා ශූරතාවය ගජබා රෙජිමේන්තුව පරදා දිනා ගැනිමට සමත් විය. ඒ අනුව 17 වන යුද්ධ හමුදා පැරා තරගාවලියේ සමස්ත අනු ශූරතාවය ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය දිනාගන්නා ලදී. තරගාවලියේ සමාප්ති දිනයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති තුමන් පැමිණිය අතර, මෙහිදී ජයග්‍රහණයන් ලබා ගත් සියලුම සෙබළුන් හා කණ්ඩායම් රනින්, රිදියෙන් හා ලෝකඩ පදක්කම්වලින් පිදුම් ලැබූහ.

තම ආබාධිත තත්ත්වය පසකලා පාබල මැණියන් රණින් සැරසිමට වෙර දරන රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ අණදෙන නිලධාරි ඇතුලු නිලධාරින්ටත්, රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු සෙසුනිලයන්ටත්, ක්‍රීඩා කණ්ඩායම භාර නිලධාරි අණදෙන ඇතුලු සියලුම ක්‍රීඩකයින්ටත් ජාතික හා ජාත්‍යන්තර තරඟ ජයග්‍රහනය කර ශ්‍රී ලංකා මාතාවත් පාබල මැණියනුත් බැබලවීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**මූලස්ථානය**
**රෙජිමූබ ශ්‍රීලපාහ**

## ලබාගත් ජයග්‍රහන

| | |
|---|---|
| සමස්ත තරඟාවලියේ | අනු ශූරතාවය |
| මලල ක්‍රීඩා | ශූරතාවය |
| සවි එසවීම | ශූරතාවය |
| සිටගෙන වොලිබෝල් | ශූරතාවය |
| වායු රයිෆල් වෙඩි තැබීම | ශූරතාවය |
| පාපැදි | ශූරතාවය |
| රෝද පුටු මැරතන් | ශූරතාවය |
| රෝද පුටු පැසිපන්දු | අනු ශූරතාවය |
| මේස පන්දු | තෙවන ස්ථානය |
| සය සමාජික ක්‍රිකට් | තෙවන ස්ථානය |
| පිහිණුම් | තෙවන ස්ථානය |
| වොලිබොල් ඉදගෙන | තෙවන ස්ථානය |



THE WHITE HACKLE

# සංග්‍රාමික වෙඩි තැබීමේ තරඟාවලිය වර්ණවත් කළ ශ්‍රීලපාහ තරු



යුද හමුදා සුළු අවි සංගමය මගින් සංවිධානය කරනු ලැබූ අන්තර් රෙජිමේන්තු සංග්‍රාමික වෙඩි තැබීමේ තරඟාවලිය මෙම වර්ෂයේ 2014 ජූනි 15 වන දින සිට 2014 ජූනි 26 වන දින දක්වා දියතලාව මීටර් 1000 වෙඩි පිටියේ පවත්වන ලදී. මෙම තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා පාබල හමුදාව වෙතින් 24 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එස්එන්එම්ජ්බී අරංඹෙපොල ශ්‍රීලපාහ ගේ නායකත්වයෙන් යුතු විවෘත අංශයේ එක් කණ්ඩායමක් ද, මේජර් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ හා මේජර් ටීඑම්ආර්කේ තෙන්නකෝන් ශ්‍රීලපාහ යන නිලධාරීන් ගේ නායකත්වයෙන් යුත් ආධුනික අංශයෙන් කණ්ඩායම් දෙකක්ද ඉදිරිපත් කළහ.





ශ්‍රීලපාහ වෙඩි තැබීම් කණ්ඩායම 24 ශ්‍රීලපාහ අණදෙන නිලධාරීගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම ඒකකය තුළ පුහුණුවීම් සිදු කර අනතුරුව තරඟාවලිය ආරම්භ කිරීමට මසකට ප්‍රථම දියතලාව වෙඩි පිටියේ පෙර පුහුණුවීම් සිදු කරන ලදී. මෙසේ කෙටි කාලයක පුහුණුවකින් පසු ශ්‍රීලපාහ විවෘත අංශයේ වෙඩි තැබීම් කණ්ඩායම වසර 14 කට පසුව තරඟාවලියේ අනුශූරතාවය දිනාගන්නා ලදී.

සංග්‍රාමික ඇඳුම් කට්ටලය සමඟ කි:මී: 09ක වෙහෙසකර වූ පා ගමනකින් පසු විවිධ දුර ප්‍රමාණයන්ගෙන් හා විවිධ ඉරියව් තුළින් වෙඩි තැබීමේ දක්ෂතා පෙන්නුම් කළ යුතු වූ මෙම තරඟාවලිය සියලු ක්‍රීඩකයන්ගේ උනන්දුව හා කැපවීම මධ්‍යයේ මෙන්ම කර්නල් ජීඑම්සීකේබී ඒකනායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ මඟ පෙන්වීම යටතේ මෙම ජයග්‍රහණය ලබාගත් බව සඳහන් කළ හැක. එමෙන්ම මේජර් එන්ජීජේඑම් සමරසිංහ ශ්‍රීලපාහ යන නිලධාරී සමඟ වර්ණ සැරයන් කරවිට කේඩබ්ලිව්ජ්පීකේ හා ලාන්ස් කෝප්‍රල් සෙනරත් කේකේඩබ්ලිව් යන ජ්‍යෙෂ්ඨ කොනොනි හා කොනොනි ද උපදේශකයන් වශයෙන් මෙම ජයග්‍රහණය සඳහා දායකත්වයක් සපයන ලදී.

එම තරඟාවලියේදී කණ්ඩායමේ නායක ලුතිනන් කර්නල් එස්එන්එම්ජ්බී අරංඹෙපොල ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් අණදෙන නිලධාරීන්ගෙන් දෙවන ස්ථානය ද, කපිතන් එස්එන් හල්වතුර ආර්එස්පී ශ්‍රීලපාහ කපිතන් නිලයෙන් තුන්වන ස්ථානය සහ දෙවන ලුතිනන් එච්ආර්එන් සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ දෙවන ලුතිනන් නිලයෙන් තුන්වන ස්ථානය හිමිකර ගන්නා ලදී. ලාන්ස් කෝප්‍රල් විජේරත්න පීඑච්ජී විසින් තනි ක්‍රීඩකයෙකු විසින් ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව වන ලකුණු 250න් ලකුණු 236ක් හිමිකරගෙන ලාන්ස් කෝප්‍රල් නිලයෙන් ප්‍රථම ස්ථානයත් සමස්ත තරඟාවලියේ ක්‍රීඩකයන් 400 දෙනෙකු අතුරින් දෙවන ස්ථානයත් ලබාගනිමින් පාබල හමුදාවට කීර්ති නාමයක් ගෙන දුනි. තවද යුද්ධ හමුදාධිපති පදක්කම ලබා ගනිමින් ප්‍රගුණ වෙඩික්කරු ලාංඡනය පැළඳීම සඳහා ක්‍රීඩකයින් 10 දෙනෙකු සුදුසුකම් ලැබීමද කැපී පෙනිණි. එමෙන්ම ජ්‍යෙෂ්ඨ නිලධාරී අංශයෙන් තරඟ කර තුන්වන ස්ථානය ලබාගනිමින් කර්නල් ජීඑම්සීකේබී ඒකනායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී පාබල හමුදාවට කීර්තියක් ගෙන දීමට සමත් විය.

**මූලස්ථානය - 24 ශ්‍රීලපාහ**



# පුතුණු මගේ



ද් රට රකින්නට හමුදාවට | පුත්තු
පෙම් කිරිවලට ලැබ | ගත්තු
මව්පිය රැකවරණ ලබලා දුන් | පුත්තු
බිහිකරලා දෙමුකෝ සසරින් මේ | ඇත්තු

ඇත්ගාලේ දරු පෙම ඔබ අසල | ඇති
අම්මලා අප සැමට කිරි එරෙන් | ඇති
ගංගාවකට දුක් කඳුළැලි වැටෙන් | ඇති
අම්මේ අප සැමගේ ලේ ටික සිඳිලා | ඇති

යුදු බිම මැදට පැනලා එඩිතර | පුත්තු
මාවිල් සොරොව්වෙන් ජලකඳ | අරගත්තු
රන් අකුරින් ඉතිහාසය නම | ගත්තු
නිවනට යමුකෝ අපිමා හා පිරු | පුත්තු

නැහැ අද වෙඩි හඬ ලක්බිම බේරු විරු | පුතුනේ
තිස් අවුරුදු යුදගිනි මැද්දෙ යුද්දෙන් මියගිය | පුතුනේ
අම්මාවරුණේ දුක් නොවේ ඔබ ශක්තිය දන්නේ අප | පුතුනේ
අම්මාවරු සහ පුතුණේ ඔබ සැම කෙදිනක හෝ යමු | නිර්වාණේ

පුත්වරු ඇතත් අම්මාවරු හට | එමට
එක ඇස වගේ පුත නුඹ පමණයි | මෙමට
සෙවණැල්ලක් වෙලා සිටියේ නුඹයි | මට
පත් දුක කිමද දෙවියණි අප පුතුන් | හට

6 ශ්‍රීලපාහ ඒකක සමගින් රාජකාරී කර ක්‍රියාත්මකයේදී
මියගිය සෙ/303528 ලාකෝ ගුණපාල ඩීකේ ගේ
මව එච් බේබිනෝනා

# සපත්තුව

උඩින් යසට හිඹුණත්
හොඳ පැහැ ගන්වා
යටින් පතුලේ ගල් ඇණෙනා
මම පළඳින සපත්තුව
වගෙයි කියා මට සිතුනා
වැඩි දෙනෙකුගේ ජිවිතය

කෝප්‍රල් දිසානායක ඩීඑම්ජේ
ඩී කණ්ඩායම - 8 ශ්‍රීලපාහ

# ජීවිතයයි

- විනීතකම ජීවිතය නිසිමග යාමට මඟ පෙන්වයි.
- ජීවිතයේ උසස්ම සතුට ලබාගත හැක්කෙ සිතට එකඟව කටයුතු කිරීමෙනි.
- ජීවිතය එක් පරම්පරාවකට පමණි. එහෙත් හොද නම සදාකාලිකය.
- ජීවිතය යනු මුළුමනින්ම යුද්ධයකි.
- ජීවිතයට අවංක භාවය තරම් වටිනා උරුමයක් තවත් නැත.
- ජීවිතය සාර්ථක කර ගැනීම නම් ඈත පෙනෙන අඳුර ගැන නොතැවී ඉදිරියේ ඇති ප්‍රශ්න වලට මුහුණ දෙන්න.
- ජීවිතය යනු අඳුරු වංගු පසුකර ගෙන යන ගමනකි. ඒවා ජයගැනීම ජීවිතයේ ආලෝකයයි.
- නොහික්මුණු කම ක්‍රියා කරවීම තරම් භයානක දැකුමක් ලොව නැත.
- කෝපය වනාහි සිත නැමැති පහන නිවා දමන සුළඟකි.
- අෂත්‍යට වේගයක් ඇත. එහෙත් සත්‍යට ඇත්තේ පැවැත්මකි.

ඩබ්ලිව්කේ අශේනි රසාංගිකා
නැදිගම්විල - තිස්සමහාරාමය

# නිශ්ශබ්දතාවය

තිශ්ශබ්දතාවය යනු යම් අයකුගේ
දුර්වල කමද නොවේ - බියගුළු කමද නොවේ
තිශ්ශබ්දතාවය යනු යමෙකුගේ අධිෂ්ඨානය,
විනය, ඉවසීම හා උගත්කමෙහි මුර දොරටුවයි...

සෙ/307183 ලාකෝ හේවාවලගේ ජේපී
26 ශ්‍රීලපාහ


# කඳුළ



සලුන මිඳ නළයි
අඳුරට ඇයද ශ්‍රිකරයි
බිඳෙන රළ පෙළයි
මගේ සිතුවිලිද බොඳ කරයි
හිරුද සැගව යයි
තරු කැට ගුවනේ සැරිසරයි
සිහින පොද නොවෙයි
සුපුරුදු කඳුළු මට හොදයි

සෙ/326917 ලාකෝ ප්‍රනාන්දු වයිඑච්වීටී
ඩී කණ්ඩායම - 8 ශ්‍රීලපාහ

# ගස්වැල්



ගස් වැල් අපෙ යාළුවෝ
හුස්ම ගන්න කෑම ගන්න
උදවු කරන යාළුවෝ
අපි එක්කම ලඟන් ඉන්න
අපේ හොඳම යාළුවෝ

නදුන් දර්ශක ගුණරත්න
මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහගේ පුතුණුවන්

# දසුනේ හසුන

තල් රුප්පාවේ ඔබ ලේ හැලූ වැලි       අස්සේ
ඔබේ අවසන් හුස්ම මුසු මඳ නළ       ඔස්සේ
සිහිකර පියාණෙනි ඔබ කඳුළැලි       වැස්සේ
පහනක් තබමි මට තව ඔබේ මුව       දිස්සේ

කටෝර වූ තල් රුප්පාව
    වදා ගිනිගත් බව       දැනෙනවා
ඔබ හෙලූ අවසන් හුස්මවල
    සුවඳ තවත් මට මෙහි       දැනෙනවා
මේ දඹකොළ පවුනට ඇවිත්
    ඔබේ දුව මල්       පුදනවා
මෙපින් බලයෙන් නිවන්පුර
    රුවන් දොර තාත්තට       ඇරෙනවා



හසුන ඃ- සෙ/307418 කෝප්‍රල් ආනන්ද බිජ් - 20 ශ්‍රීලපාහ
දසුන ඃ- 11 ශ්‍රීලපාහ බලඇණි දින සංවත්සරයේදී

## ප්‍රහේලිකා අංක 60 - 81 වන වයිට් හැකල් සඟරාව

නිවැරදි විසඳුම්පත් 2014 දෙසැම්බර් මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරඟ කූපනය සහ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

### වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 60

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | 6 | 3 | | | | 8 | 1 | 7 |
| 4 | 1 | 5 | | | | 6 | 2 | 9 |
| 8 | 7 | 9 | | | | 5 | 4 | 3 |
| | | | 2 | 6 | 3 | | | |
| | | | 7 | 3 | 4 | | | |
| | | | 1 | 9 | 5 | | | |
| 5 | 9 | 6 | | | | 4 | 7 | 2 |
| 3 | 8 | 7 | | | | 9 | 5 | 1 |
| 1 | 2 | 4 | | | | 3 | 8 | 6 |

*ප්‍රහේලිකාව ගැන...*

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.
2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.
3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.
4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.
5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.
6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

# වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 58

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 4 | 3 | 5 | 7 | 2 | 9 | 8 | 6 |
| 2 | 8 | 7 | 3 | 6 | 9 | 4 | 1 | 5 |
| 9 | 6 | 5 | 4 | 1 | 8 | 7 | 2 | 3 |
| 6 | 7 | 1 | 9 | 4 | 5 | 8 | 3 | 2 |
| 4 | 2 | 8 | 7 | 3 | 1 | 6 | 5 | 9 |
| 5 | 3 | 9 | 2 | 8 | 6 | 1 | 4 | 7 |
| 7 | 5 | 4 | 8 | 9 | 3 | 2 | 6 | 1 |
| 3 | 9 | 6 | 1 | 2 | 4 | 5 | 7 | 8 |
| 8 | 1 | 2 | 6 | 5 | 7 | 3 | 9 | 4 |

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගි විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරයේ වම් පස උඩ කෙලවරේ **"වයිට් හැකල් ප්‍රහේලිකා අංක 60"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රෙම ශ්‍රීලපාහ,
යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ, හෝමාගම.

## මෙවර ජයග්‍රාහකයෝ

**ප්‍රථම ස්ථානය**

සෙ/315007 සැරයන් ප්‍රේමසිරි පීජීඑල්ඩබ්ලිව්,
රෙජිමුන්ත ශ්‍රීලපාහ,
යුද හමුදා කඳවුර,
පනාගොඩ - හෝමාගම.

**දෙවන ස්ථානය**

සෙ/ඩී100065 සාසෙ පුෂ්පකුමාර එන්වීඅයි,
9 (සෙව්) ශ්‍රීලපාහ,
යුද හමුදා කඳවුර,
ඇතාවැටුනු වැව - වැලිඔය.

**තුන්වන ස්ථානය**

සෙ/317684 කෝප්‍රල් ද සොයිසා එච්බීඑස්,
සංඥා අංශය රෙම ශ්‍රීලපාහ,
යුද හමුදා කඳවුර,
පනාගොඩ - හෝමාගම.

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**අංක 60**

**කූපනය**

අංකය : ..................................

නිලය : ..................................

නම : ..................................

රාජකාරි ලිපිනය : ..................................

..................................

..................................

ඒකකය : ..................................

ජාතික හැඳුනුම්පත් අංකය : ..................................




# WAR HEROES MEMORIAL SRI LANKA LIGHT INFANTRY

අප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රානදානයෙන් ඇප කැප වූ පාබල හමුදා නිලධාරින් හා සෙබළුන් සදා අනුස්මරණය කිරීම සඳහා රෙජිමේන්තු අධිපතිතුමන් ගේ සංකල්පයකට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරින් ජ්‍යෙෂ්ඨ සේවා අත්දැකීම් ඇති විශ්‍රාමිකයින් හා සියළුම සෙබළුන්ගේ දිරිමත් කිරීම් හා ශ්‍රම ධන පරිත්‍යාගයෙන් යුතුව ඉදි වන රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් කටයුතු සිදු වන ආකාරය ඡායාරූපවලින් දැක්වේ.







# උදාරයි ඔබ අපට සැමදා

